සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | I, II | පැය තුනයි |
| சிங்களமொழியும் இலக்கியமும் | I, II | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature | I, II | Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**උපදෙස් :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** බොහෝ අය උත්සාහ කරනුයේ **මඩිය තර කර ගැනීමට** ය.
(1) අන්‍යයාගේ දේ පැහැර ගැනීමට
(2) තමන්ට නියමිත ප්‍රතිලාභ වැඩි කර ගැනීමට
(3) නොනිසි ලෙස ලාභ ලබා ගැනීමට
(4) තම ධනය ස්ථාවර කර ගැනීමට

**2.** තම හාම්පුතාට **යකා වැහී** ඇතැයි සිතූ සේවකයෝ නිහඬ වූහ.
(1) යකකු ආවේශ වීම  (2) වෛරයෙන් පළි ගැනීම
(3) කෝපාවිෂ්ට ව බැණ වැදීම  (4) තදින් කෝප වීම

**3.** උමතුවෙන් පෙළුණු ඔහු **ඉබාගාතේ** ගියේ ය.
(1) අරමුණක් නැති ව ගමන් කළේ ය.
(2) ඈත-මෑත ගමන් කළේ ය.
(3) අරමුණක් ඇති ව ගමන් කළේ ය.
(4) උම්මත්තකයකු සේ ගමන් කළේ ය.

● අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** රටෙහි වර්තමාන ආර්ථික තත්ත්වය විධිමත් ව ............................ කර ගත යුතු ය.
(1) නවීකරණය  (2) කළමනාකරණය  (3) නිරාකරණය  (4) වර්ගීකරණය

**5.** සැමියාගේ වියෝව ඇයට බෙහෙවින් ම ........................ සිතුවිල්ලක් විය.
(1) ප්‍රයෝගකාරී  (2) ආවේගකාරී  (3) විනාශකාරී  (4) වේදනාකාරී

**6.** දේශනය අවසානයෙහි කථිකයා සියලු කරුණු ............................ කොට දැක්වී ය.
(1) සම්පිණ්ඩනය  (2) සම්භාෂණය  (3) සම්පාදනය  (4) සම්මිශ්‍රණය

[දෙවැනි පිටුව බලන්න.

7. සැම පදයක ම පදවල අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) කලාඳුරු, ගුරුමුෂ්ටි, පරමාණු, පිළිසකර (2) ග්‍රීෂ්ම, චුම්භක, පිළියෙල, ප්‍රතිනිර්මාන
(3) බිහිසුනු, බැළලී, මයිලණු, මෘධුකාංග (4) බුමුතුරුණු, මධ්‍යකාලීණ, මුඛ්‍යාර්ත, රළුපරළු

8. දේශය, රූකඩ, තාරාවා, නෞකාව යන වචනවල **පළමු අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කොම්බුව හා ගයනුකිත්ත, දිගු පාපිල්ල, ඇලපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය
(2) කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, ඇලපිල්ල, දිගු පාපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත
(3) කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දිගු පාපිල්ල, ඇලපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත
(4) කොම්බුව හා ගයනුකිත්ත, දිගු පාපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, ඇලපිල්ල

9. 'මිතුරා' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
(1) ඕෂ්ඨජ, තාලුජ හා දන්තජ ය. (2) කණ්ඨජ, ඕෂ්ඨජ හා දන්තජ ය.
(3) දන්තජ, තාලුජ හා මූර්ධජ ය. (4) ඕෂ්ඨජ, දන්තජ හා මූර්ධජ ය.

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) කාන්තාරය, සෙවණැල්ල, විරෝධය, පණිවුඩය
(2) කණ්ඩායම, කලියුගය, පෝෂණය, මර්දනය
(3) ප්‍රාචීන, බහුශ්‍රැත, බාලදක්ෂ, නටබුන්
(4) ක්‍රියාවලිය, බාදනය, සන්නිවේදනය, ප්‍රතිපාදනය

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) නිවේදකයකු, පාලකයෙක්, ශ්‍රමණයෙක්, ගුරුවරයකු
(2) ගිරවුන්, ආගන්තුකයෙක්, සෙබළකු, ධනපතීන්
(3) දෙවියන්, ඇදුරකු, අප, නිළියක
(4) කපුටකු, දියණියන්, විවේචකයෙක්, ගායකයකු

12. 'අතරමං වුණු ළමයි දින දෙකකට පසු වනයෙන් එළියට පැමිණියහ.' යන වාක්‍යයෙහි '**වනයෙන්**' යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) අවධි (2) කරණ (3) ආධාර (4) කර්ම

13. 'සුනිමල' යන්න අයත් වන සමාසය කුමක් ද?
(1) විශේෂණ (2) විභක්ති (3) අන්‍යාර්ථ (4) අව්‍යය

14. 'අලංකාර + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) අලංකාරික (2) අලංකාරයික (3) ආලංකාරික (4) ආලංකරික

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) උපසර්ග - දුර්ජන, දුර්මුඛ, දුර්ගන්ධ, දුරාචාර
(2) මිශ්‍ර ක්‍රියා - කමින්, නමින්, යමින්, දෙමින්
(3) තද්ධිත - ධනවන්ත, බලවන්ත, කුලවන්ත, ගුණවන්ත
(4) සන්ධි - කර්මානුරූප, ධර්මානුකූල, ස්වර්ණාභරණ, දේවාරූඪ

16. **ප්‍රයෝජ්‍ය ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
(1) රජතුමා වැවක් සාදවයි. (2) අම්මා දරුවා නළවයි.
(3) නිලධාරියා ලියුමක් යවයි. (4) ඔහු ආරාධිත අමුත්තාට අසුනක් පනවයි.

● අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. **දක්ෂිණාවෘත ශංඛය** වනාහි මංගල සම්මත වස්තුවකි.
(1) දකුණු පස බලා සිටින හක්ගෙඩිය (2) දකුණු පැත්තට කරකැවුණු හක්ගෙඩිය
(3) දකුණු අතට ගන්නා හක්ගෙඩිය (4) දකුණු ප්‍රදේශයෙන් හමු වූ හක්ගෙඩිය

18. **පරෝපකාරය** වනාහි උතුම් ගුණාංගයකි.
(1) සියලු දෙනාට උපකාර කිරීම (2) අනෙක් තැනැත්තන් උපකාර කිරීම
(3) විදේශිකයන්ට උපකාර කිරීම (4) අන්‍යයන්ට උපකාර කිරීම

**19.** සමහරු **අදෘශ්‍යමාන** බලවේග පසු පස හඹා යති.
(1) ඇසින් දකින (2) ඇසට නොපෙනෙන
(3) ඇසට පෙනෙන (4) දැකීමට අපහසු

**20.** දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවත්නා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) ගල්, ගඩොල්, වැලි, සිමෙන්ති
(2) පැදුර, ඇඳ, කොට්ටය, ඇතිරිල්ල
(3) පිඟාන, කෝප්පය, හැන්ද, ගැරුප්පුව
(4) නවකතාව, කෙටිකතාව, සාකච්ඡාව, චිත්‍රය

**21.** එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | කුසුම - පුෂ්පය, | එල - ගෙඩි, | රථය - රිය, | රාත්‍රිය - රෑ |
| (2) | ශෛල - සෙල්, | වර්ෂා - වැස්ස, | කකුල - දණහිස, | ලෝකය - ජගත් |
| (3) | වතුර - පැන්, | වනිතා - මාතා, | තාත්තා - පියා, | මාළු - මත්ස්‍ය |
| (4) | යහළු - යෙහෙළි, | වසර - අවුරුද්ද, | සෙනසුරාදා - ශනිදා, | කෝච්චිය - දුම්රිය |

**22.** මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) බිරිඳ - අඹුව, පතිනිය, බිරිය, ස්වාමි දියණිය
(2) ග්‍රන්ථය - පොත, පුස්තකය, කාව්‍යය, ගත
(3) දෙවඟන - සුරාංගනා, දිව්‍යාංගනා, සුරඹ, සුරඟන
(4) භික්ෂුව - මහණ, ශ්‍රමණ, හාමුදුරුවෝ, ස්වාමීන් වහන්සේ

**23.** **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) දුක - සතුට (2) අභ්‍යන්තර - බාහිර
(3) පදවි - තානාන්තර (4) ඉහළ - පහළ

**24.** **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'පිනැති' යනු ස්වර සන්ධියට අයත් පදයකි.
(2) 'අක්ෂර' යනු ස්වර පමණක් හැඳින්වීම සඳහා යොදන නාමයකි.
(3) 'වැටුණේ ය' යන්න අතීත කාල, ඒකවචන ක්‍රියා පදයකි.
(4) 'රජතමය' යන්නෙන් 'රිදියෙන් කරන ලද' යන අර්ථය ලැබේ.

**25.** පහත දක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලනික ව්‍යූහය විධිමත් ව පවත්වාගෙන යාම පාලකයාගේ යුතුකම ය.
(2) අසරණ වීථි සුනඛයන්ගේ ආරක්ෂාව ද රාජ්‍ය නොවන සංවිධාන මැදිහත් විය යුතු ය.
(3) නීති විරෝධි මද්‍යපාන නිෂ්පාදනය, ප්‍රවර්ධනයට හා ප්‍රවාහනය තහනම් කරමු.
(4) අධ්‍යාපනය නංවාලීමෙන් විෂය නිර්දේශ සංශෝධනය විධිමත් කළ හැකි ය.

● අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

**26.** අවශ්‍යතාවේ ස්වරූපය අනුව තම මතය වෙනස් කිරීම
(1) හක්කේ බුදුරුස් බොක්කෙ දඩමස් කීවා ලු.
(2) උලත් එකයි පිලත් එකයි කීවා ලු.
(3) ඉබ්බා වතුරට දැම්මා ම ඇන්නැවේ කීවා ලු.
(4) කන්න ඕන උණා ම කබරගොයත් තලගොයා වෙනවා ලු.

**27.** අය මාර්ග මුළුමනින් ම විනාශ කර දැමීම
(1) කටින් බතල කොළ හිටවනවා වගේ.
(2) කබලෙන් ලිපට වැටුණා වගේ.
(3) අතු කඩා මොර කන්නා වගේ.
(4) ගලෙන් පට්ටයක් ගන්නවා වගේ.

**28.** පූර්වරූප සන්ධියට හා පරරූප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) ගෙත්තම්, ගොක්කොළ (2) හද්දවස, ගොක්කොළ
(3) ගොක්කොළ, ගෙත්තම් (4) හද්දවස, ගෙත්තම්

● අංක **29, 30** යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) අඥානයෙක් සේ වැඩ නො කරන්න.
(2) දද පෙළ මඳ සුළඟට සෙලවුණෝ ය.
(3) සංචාරක කුරුල්ලන් ලංකාවට පැමිණ ඇත.
(4) ශිෂ්‍යයෝ ද ශිෂ්‍යාවෝ ද මම ද රැස්වීමට සහභාගි වුණෙමි.

**30.** (1) ධනවතා හෝ බලවතා හෝ ගුණවතා තුන් කොන් සටන ජය ගත්තෝ ය.
(2) ඥානවන්තයෝ ශාස්ත්‍රවන්තයන් වෙති.
(3) රිය අනතුරු වැළැක්වීමට පොලිස් නිලධාරීන් වග බලා ගනිති.
(4) නායකයන් රට ගොඩ නඟති'යි වර්තමාන තරුණ පිරිස සිතති.

**31.** ● සමහරු රට රැකියා ලබා ගැනීම ............................ අනාරක්ෂිත මුහුදු ගමන්වල යෙදෙති.
● අප මේ රට සංවර්ධනය කළ යුත්තේ අනාගත දරුවන් ............................ ය.
● පුතණුවනි, අභිමානවත් පුරවැසියකු ............................ ජීවත් වන්න.
● ඔහු දන්ත වෛද්‍යවරයකු ............................ වැඩ කළේ ය.
ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
(1) පිණිස, වෙනුවෙන්, මෙන්, ළඟ (2) පිණිස, ළඟ, මෙන්, වෙනුවෙන්
(3) වෙනුවෙන්, ළඟ, මෙන්, පිණිස (4) වෙනුවෙන්, මෙන්, පිණිස, ළඟ

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"නිච්චියට ම කියන්න ඇහැකි ය?"
(1) නිශ්චිත වශයෙන් කීමට නොහැකි ද?
(2) නිශ්චිත ව ප්‍රකාශ කිරීම දුෂ්කර ද?
(3) නිශ්චිත වශයෙන් ම කීමට හැකි ද?
(4) නිශ්චිත ව ම කීම යෝග්‍ය ද?

**33.** කතාබහෙන් සිනාසෙමින්
**ජීවිතයේ ගිරිදුර්ගය**
නගින
සොඳුරු ගැහැනිය ඔබ
ඉහත පද්‍ය පාඨයේ **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස
(1) උපමාවකි. (2) අතිශයෝක්තියකි. (3) රූපකයකි. (4) ස්වභාවෝක්තියකි.

**34.** 'සිනා කුමරි' කාව්‍ය නිර්මාණයේ රචකයා කවරෙක් ද?
(1) මහගම සේකර (2) චන්ද්‍රරත්න මානවසිංහ
(3) ජී. බී. සේනානායක (4) මොනිකා රුවන්පතිරණ

**35.** අලගියවන්න මුකවෙටිතුමා විසින් රචිත කෘතියක් **නොවන්නේ** මින් කුමක් ද?
(1) සිරිත් මල්දම (2) සැවුල් සන්දේශය
(3) කුස ජාතක කාව්‍යය (4) දහම් සොඬ දා කව

**36.** පහත සඳහන් කවියෙහි තුන්වන පදය තෝරන්න.

ඔබහට අත පොවනට උන්-මුන්හට ඉඩ නො තබමු ලංකා
අව හොත් මෙහි උන් ලුහුබඳවා ගොළු මුහුද ගෙවමු ලංකා
..............................................................................
ඔබ වෙනුවෙන් එන වෙඩි සැර මල් පෙති සේ සලකමු ලංකා

(1) හෙළ මුතු මිණි වැල් එකට දමා ලා ඔබ සරසමු ලංකා
(2) ගොඩ දිය අහසේ හැම තැනැ ඔබගේ නම කියවමු ලංකා
(3) ගස් වැල්වලැ මල් එකට ගොතා ලා ඔබ පලඳමු ලංකා
(4) මුහුදින් අඟලක් ඔබ වැවෙතොත් එහි පනිමු පනිමු ලංකා

**37.** 'ආකස්මික ව' හා 'ප්‍රහර්ෂය' යන පදවල අදහස **නිවැරදි ව** අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) අධික සන්තෝෂය, අනුමාන සිතුවිල්ල
(2) හේතුවක් නැති ව, ඉවසීමේ ගුණය
(3) අධික සන්තෝෂය, ඉවසීමේ ගුණය
(4) හේතුවක් නැති ව, අධික සන්තෝෂය

**38.** ධීවර භාෂාවේ 'පන්න කරනවා' යනු
(1) දැල් ඇදීම ය.
(2) මසුන් මැරීම ය.
(3) මාළු වෙළෙඳාම ය.
(4) ඔරුව දියත් කිරීම ය.

**39.** "බත් උපදනා ලෙස් මා අතින් අසව. සී සෑම නම් සුළං බදනා සේ ඉතා උගහට දෙයෙක. නඟුලෙක වියදණ්ඩෙක පිටවකෙක බඩවකෙක නිමුනෙක කෙවිල්ලෙක අවකැටෙක සීවැලෙක පෙරගිලියෙක පසුගිලියෙක.. කැවිටෙක ගොන්ගෙයෙක ගොවියෙකැයි යන මේ අටළොස් දෙනාගේ එක් වීමෙන් යන්නා වූ ගමන සී සෑම් නම් වෙයි."
මේ පාඨය අන්තර්ගත වන කෘතිය කුමක් ද?
(1) පූජාවලිය (2) බුත්සරණ (3) රාජාවලිය (4) අමාවතුර

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය හෙළි වන්නේ ඔහු සිය නිර්මාණය සඳහා අර්ථවත් අත්දැකීම් තෝරා ගැනීම හා ඒ අත්දැකීම් පාඨකයාට වින්දනයක් ඇති වන ආකාරයෙන් නැවත ඉදිරිපත් කිරීම සිදු කර ඇති අන්දම අනුව ය.

(1) තම අත්දැකීම් පාඨකයාට වඩාත් සමීප වන ලෙස ප්‍රතිනිර්මාණය කිරීමට හැකි වන්නේ නිර්මාණශීලී සාහිත්‍යකරුවකුට පමණි.
(2) අත්දැකීම් තෝරා ගැනීම හා ඒවා පාඨකයාට ඉදිරිපත් කරන ආකාරය අනුව සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය පිළිබිඹු කෙරෙයි.
(3) අර්ථවත් අත්දැකීම් තෝරා ගැනීමට නොහැකි වන අවස්ථාවල දී සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය හෙළි නො වෙයි.
(4) සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය හෙළිවන්නේ උචිත අත්දැකීම් ඉදිරිපත් කරන ආකාරයත් පාඨකයා එය ග්‍රහණය කරගන්නා ආකාරයත් අනුව ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II**
சிங்களமொழியும் இலக்கியமும் **I, II**
Sinhala Language and Literature **I, II**

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

※ ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න**.

(i) සිංහල අක්ෂරමාලාවේ ඇතුළත්
- (අ) අඝෝෂ ව්‍යඤ්ජන අක්ෂරයක් ලියා දක්වන්න.
- (ආ) නාසික්‍ය අක්ෂරයක් ලියා දක්වන්න.

(ii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් තද්ධිත පද **දෙකක්** ලියන්න.
පුරාතන ගොවීන් විසින් වගා කෙරුණු දේශීය වී වර්ග භාවිතයෙන් බොහෝ රෝග සමනය වනු ඇතැයි සමහරු පවසති.

(iii) පහත සඳහන් පද විසන්ධි කරන්න.
(අ) පෙරපර (ආ) ළිංවතුර

(iv) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.
කථනයේ දී මෙන් ම ලේඛණයේ දී ද වඩාත් රසවත් ව, අර්ථවත් ව අදහස් පළ කිරීම සඳහා සාම්ප්‍රධායික යෙදුම් බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

(v) පහත සඳහන් අනුක්ත පදවල උක්ත රූප ලියා දක්වන්න.
(අ) ඔවුන් (ආ) ශිල්පියකු

(vi) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) ආගමන (ආ) අනර්ථවත්

(vii) පහත සඳහන් වාක්‍යවල **තද කළු අකුරින් මුද්‍රිත** පද අයත් වන සන්ධි පද ප්‍රවර්ගය නම් කරන්න.
- (අ) **බුත්සරණ** පොලොන්නරු අවධියට අයත් කෘතියකි.
- (ආ) **පිළිතුරු** පත් ඇගයීම විධිමත් කරන ලෙස විදුහල්පතිතුමා දැනුම් දුන්නේ ය.

(viii) පහත සඳහන් වාක්‍යයේ අන්තර්ගත වන නිපාත පද **දෙකක්** ලියා දක්වන්න.
ශිෂ්‍යයන් මෙන් ම ගුරුවරු ද අධ්‍යයන කටයුතුවල යෙදෙති.

(ix) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
- (අ) දරුවන් ගුරුවරු නමදිති.
- (ආ) විනිසුරුවරයාත් නීතිඥවරුත් උසාවියට යයි.

(x) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
- (අ) චිත්‍රපට අධ්‍යක්ෂවරයා නළුවන් හසුරුවයි.
- (ආ) ශිෂ්‍යයෝ චාරිකාවක් සංවිධානය කරති.

(ලකුණු 02 × 10 = 20 යි.)

[හත්වැනි පිටුව බලන්න.

**2.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) නිදහසේ මාධ්‍ය හැසිරවීමට අවකාශ ලැබීම යනු අසත්‍ය තොරතුරු සමාජගත කිරීමට ලැබෙන අවස්ථාවක් නොවේ. දෙස් විදෙස් තොරතුරු සමබරතාවකින් යුතු ව සමාජය වෙත සමීප කරවීම මාධ්‍යවල වගකීමයි. ඇතැම් ජනමාධ්‍ය මෙන් ම සමාජ මාධ්‍ය ද මේ කරුණු හරිහැටි වටහා ගෙන නොමැති බව වර්තමානයේ දක්නට ලැබේ. අසත්‍ය ප්‍රවෘත්ති මාධ්‍ය මගින් මුදා හැරීම මිනිස් සමාජය ප්‍රචණ්ඩත්වය කරා ගෙන යන දොරගුළු විවර කිරීමක් ද වනු ඇත. මේ නිසා මාධ්‍ය සදාචාරය පිළිබඳ නිසි වැටහීමකින් යුතු ව මාධ්‍යකරණයේ යෙදීමට මාධ්‍යකරුවන් වග බලා ගත යුතු ය.

(ආ) විදේශ විනිමය ඉපැයිය හැකි එක් ප්‍රධාන මාර්ගයක් ලෙස සංචාරක කර්මාන්තය මුල් තැනක් ගනියි. මේ බව වටහා ගත් බොහෝ රටවල් සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. සුහදශීලී, සංග්‍රහශීලී සහ ආචාරශීලී ජනතාවක් වෙසෙන, ස්වභාව සෞන්දර්යයෙන් අනූන සුන්දර පාරාදීසයක් වන ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ද ප්‍රසිද්ධ ව ඇති බැවින් සංචාරක කර්මාන්තය තවදුරටත් නගා සිටුවීමට කඩිනම් පියවර ගැනීමේ අවශ්‍යතාව කෙරෙහි බලධාරීන්ගේ අවධානය යොමු විය යුතු ය.

(ඉ) දිවයිනේ බොහෝ ප්‍රදේශවල වී ගොවිතැන සහ එළවළු වගාව මහා පරිමාණයෙන් සිදු වන අයුරු දිස්වන නමුත් පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වන අවස්ථා මෙන් ම මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළ යන අවස්ථා ද දක්නට ලැබේ. අතරමැදියන් නිසා ගොවීන්ට නිසි මිලක් නොලැබෙන අතර ම පාරිභෝගිකයන්ට වැඩි මිලක් ගෙවා ආහාර අවශ්‍යතා සපුරා ගැනීමට සිදු වී ඇත. මේ අතර එළවළු ප්‍රවාහනයේ දී සිදු වන අධික නාස්තිය ද සැලකිලිමත් විය යුතු කරුණකි. භෝග වගා කිරීමේ නිසි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විය යුතු අතර ම ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ද දැඩි අවධානයක් යොමු කිරීම කාලෝචිත වේ.

(ඊ) මිනිසාට මෙන් ම රටකට ද තම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා තාක්ෂණය අත්‍යවශ්‍ය සාධකයකි. තාක්ෂණය නිසි පරිදි හසුරුවාලීම මගින් විවිධ රටවල් තම අනාගත ඉලක්ක ජයගෙන ඇති ආකාරය පුදුම සහගත ය. ඉන් ප්‍රධාන අවස්ථාවක් ලෙස කෘත්‍රිම බුද්ධිය යොදා ගැනීම දැක්විය හැකි ය. මිනිස් මොළය වෙහෙසා කළ යුතු කාර්යයන් සඳහා ඉතා සුළු වේලාවක් තුළ නිශ්චිත විසඳුම් ලබා දීමට කෘත්‍රිම බුද්ධිය සමත් වී ඇත. නවීන තාක්ෂණය මිනිසාගෙන් ඔබ්බට ගමන් කරන ආකාරයක් දිස්වන අතර ම එය මිනිසා අබිබවා යන දිනය වැඩි ඈතක නොවන අයුරක් ද විද්‍යමාන වේ.

(ලකුණු 25 යි.)

**3.** පහත දැක්වෙන පාඨය වචන **60 - 70** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

අහස, පොළොව, ජලය, සුළඟ හා ස්වාභාවික පරිසරය ද මිනිසාගේ පැවැත්මට බාධා ගෙන දෙමින් විපරීත තත්ත්වයට පත් ව ඇත්තේ ය. හඳුනාගත නොහැකි බොහෝ ලෙඩ රෝග වැළඳීමටත් ස්වභාවධර්මය අකාරුණික ලෙසට මිනිසාට එරෙහි ව නැඟී සිටීමටත් පටන් ගෙන ඇති බවක් පෙනෙන්නට තිබේ. මෙම අකාරුණික තත්ත්වයට වගකිව යුත්තේ අන් කිසිවකු නොව මිනිසා ම ය. මිනිසාගේ දිවි පැවැත්මට හා ඉදිරි ගමනට ආධාර උපකාර කළ ස්වභාවධර්මයට මිනිසා අකාරුණික වීම මෙම ව්‍යසනවලට එක් හේතුවකි. අප අවට ඇති බොහෝ ස්වාභාවික මෙන් ම භෞතික වස්තූන් ද මිනිසා විසින් මිනිසාට එරෙහි ව නිපදවා ඇති බොහෝ විනාශකාරී දේ ද අද මිනිසාට විශාල ගැටලුවක් ඇති කර තිබේ. මෙම තත්ත්වය තවමත් අප තේරුම් ගෙන නොමැත. මේ නිසා වර්තමානයේ ජීවත් වන ජනතාවට නැවත වරක් ආපසු හැරී බලන්නට සිදු වී ඇත. අනාගත ලෝකය වඩාත් යහපත් තැනක් බවට පත් කිරීමේ මෙහෙයුම දියත් කිරීම කඩිනමින් ආරම්භ කළ යුතු වන්නේ මේ වන විටත් සොබාදහම සහ අප ජීවත් වන අවට පරිසරය විශාල සෝදා පාළුවකට, විපතකට හා විනාශයකට පත් ව ඇති නිසා ය. සදාචාරාත්මක යයි ගැනෙන සියලු දේ පිරිහීමට ලක් ව ඇත්තේ ය. එමෙන් ම ශිෂ්ටාචාරය විසින් අපට උරුම කළ බොහෝ දේත් ස්වභාවයෙන් ම අපට ලැබුණු ලෙඩ රෝගවලින් වැළැකීමේ ශක්තියත් කායික-මානසික සුවතාවත් විනාශ වී ගොස් ය. මෙම තත්ත්වය ඉදිරියේ දී තව තවත් වර්ධනය වීමට ඇති ඉඩකඩ අතිවිශාල ය.

(ලකුණු 10 යි.)

**4.** පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට **පිළිතුරු** සපයන්න.

වැව, මුළු ගම්වැසියන්ට පොදුවේ අයිති ව තිබුණ ද, එයින් ජලය ලැබූ පෙදෙස, ප්‍රමාණයත් අස්වැන්නත් අතින් එකිනෙකට වෙනස් වූ කොටස්වලට බෙදා තිබුණි. එහෙත්, ජලය අපතේ යෑම වළක්වනු සඳහා සී සෑමත් කුඹුරුවලට වතුර ඇරීමත් නියම පිළිවෙළකට කළ යුතු විය. කුඹුරු වගා කිරීම පිළිබඳ මේ ආදි කටයුතු පාලනය කිරීම පිණිස 'වෙල්කැමි' ආදි නම් ඇති නිලධාරීන් සිටි බව නවවැනි, දසවැනි සියවස්වලට අයත් සෙල්ලිපිවලින් පෙනෙයි. සී සෑම් ආදි වැඩවල දී මේ නීතිරීති අනුගමනය නොකළ ගොවීන්ට දඩ ගසන ලදි. තමන්ගේ කුඹුරු කොටස් නියම කාලයේ දී වගා කිරීම අතපසු කළ ගොවීන්ට ද දඩ ගසන ලදි. නියම වාරයේ දී ජලය සැපයීම සහ සී සෑම පිළිබඳ ප්‍රශ්න පමණක් නොව, ඒ ඒ කුඹුරුවල වැපිරිය යුතු වී වර්ගය කුමක් ද යන්න තීරණය කර ගැනීමට පවා ඒ ඒ ගොවියාට ඉඩ තිබුණේ නැත. තිසා වැවෙන් ජලය සපයනු ලබන, ඉසුරුමුණි වෙහෙරට අයත් කුඹුරුවල සිහිනැටි (හීනැටි) වැපිරිය යුතු බව ඒ වැවෙන් ජලය බෙදා හැරීම පිළිබඳ නීතිරීති ඇතුළත් කර IV මහින්ද රජු පිහිට වූ සෙල්ලිපියේ කියා තිබේ. හේන් ගොවිතැන් කරනු ලැබූ ඉඩම් ගැන සෙල්ලිපිවල සඳහන් වන කරුණුවලින් පෙනෙන්නේ දසවැනි සියවසේ දී ඒ ඒ ධාන්‍ය වර්ග වැපිරිය යුතු ඉඩම් යායවල් මේ මේවා යයි රජයෙන් නියම කර තිබුණු බවයි.

නවවැනි සහ දසවැනි සියවස්වල දී ගොවිතැන් කරන ලද්දේ එක්තරා සැලැස්මක් ඇති ව බව මෙයින් පෙනෙයි. රටවැසියන්ගේ ජීවිතය සඳහා අවශ්‍ය ද්‍රව්‍යවලින් සමහර ඒවා හිඟ වීමටත්, සමහර ඒවා වැඩියෙන් නිෂ්පාදනය කිරීමටත් ඉඩ නො තබා අවශ්‍ය ප්‍රමාණයට නිෂ්පාදනය කිරීම එහි අදහස විය. සියලු රටවැසියන්ගේ යහපත සඳහා උවමනා තරමට ගොවියාගේ නිදහස මෙපරිද්දෙන් සීමාකර තිබුණේ ය. ඉඩම්වල වගා කරන ලද භෝග ජාති අතින් හෝ සාමාන්‍යයෙන් කෘෂි අර්ථක්‍රමය අතින් හෝ මේ යුගයේ තත්ත්වයත්, මීට පෙර යුගයේ තත්ත්වයත් අතර වැදගත් වෙනසක් නො වී ය. තමා විසින් නිපදවන ලද අස්වැන්නෙන් එක්තරා කොටසක් කිසියම් ආරාමයකට හෝ උසස් නිලධාරියෙකුට හෝ රාජවල්ලභයෙකුට හෝ ආරෝග්‍යශාලා ආදි පුණ්‍යායතනයකට හෝ ගෙවීමට සෑම ගොවියෙකුට ම පාහේ සිදු විය. තව ද අස්වැන්නෙන් නියමිත කොටසක් දියබද්ද වශයෙන් දීමට ද ගොවියාට සිදු විය. වත්තේ හෝ හේනේ වවන ලද ද්‍රව්‍යවලිනුත්, එහි දී ලබාගත් පස්ගෝරසවලිනුත් කිසියම් නියමිත කොටසක් ඉඩම් හිමියාට දීමට සිදු විය. එහෙත්, මේවා පිළිබඳ විස්තර දැන ගන්නට නැත. රටේ එක් ප්‍රදේශයක පිළිවෙළ වෙනත් ප්‍රදේශයක පිළිවෙළට වඩා වෙනස් වූ බව පෙනෙයි.

(i) ජලය අපතේ යෑම වැළැක්වීම සඳහා අනුගමනය කෙරුණු ක්‍රියාමාර්ග **දෙක** මොනවා ද?

(ii) ගොවීන් දඩ ගැසීමට ලක් වූයේ කිනම් කාරණා සම්බන්ධයෙන් ද?

(iii) ඉසුරුමුණි වෙහෙරට අයත් කුඹුරුවල වැපිරිය යුතු වී වර්ග පිළිබඳ ව සඳහන් වන මූලාශ්‍රය කුමක් ද?

(iv) නවවැනි හා දසවැනි සියවස්වල දී සැලැස්මක් ඇති ව ගොවිතැන් කටයුතු සිදු කිරීමෙන් අදහස් කරන ලද්දේ කුමක් ද?

(v) ගොවියාගෙන් ඉඩම් හිමියාට ලැබුණේ මොනවා ද?

(ලකුණු $02 \times 5 = 10$ යි.)

**5.**
- පනාතැන්න සහ බෝදාගම නගරය යා කරමින් ගඟ හරහා ඉදිකර ඇති මඟී පාලම අබලන් තත්ත්වයක පැවතීම
- දැනට පාරු සේවයක් ආරම්භ කර ඇතත් එදිනෙදා විවිධ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට නගරයට යන්නන් සඳහා එය ප්‍රමාණවත් නොවීම
- ගමේ සිට නගරය දක්වා ඇති කිලෝමීටර තුනක් පමණ වූ මහාමාර්ගය ද අබලන් වී ඇති බැවින් බස්රථයක් ධාවනය නොවීම

ඉහත කරුණු යටතේ මඟීන්ට අත්විඳීමට සිදු ව ඇති දුෂ්කරතා විස්තර කරමින් පාලම කඩිනමින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලා නගර සභාවේ නගරාධිපති වෙත යැවීම සඳහා සුදුසු රාජකාරි ලිපියක් ලියන්න.
(ඔබ පනාතැන්න ග්‍රාමෝදය සමිතියේ ලේකම් අරුණ ජයමහ යැයි සිතන්න.)

**නැතහොත්**

අංක 360, නවනගරය, බෝදාගම පිහිටි, මුළුතැන්ගෙයි උපකරණ සහ විදුලි උපකරණ ආනයනය කර බෙදා හරින පෞද්ගලික සමාගමක් වන X - ලංකා ආයතනය සිය වෙළෙඳ ජාලය පුළුල් කිරීමේ අරමුණින් පාරිභෝගිකයන්ට සහන රාශියක් හඳුන්වා දීමට අපේක්ෂා කරයි.

- භාණ්ඩ මිල දී ගැනීමේ දී වාරික මගින් ගෙවීමේ පහසුකම්
- මිල දී ගන්නා භාණ්ඩවල වටිනාකම අනුව 5% - 15% දක්වා විශේෂ වට්ටම්
- තමාට අවශ්‍ය භාණ්ඩ නිවසට ම ගෙන්වා ගැනීමේ පහසුකම්
- භාණ්ඩ සඳහා වසර දෙකක වගකීමක්
- අලෙවියෙන් පසු සේවාව

මේ කරුණු ඇතුළත් කරමින් පුවත්පතක පළ කිරීමට සුදුසු ආකර්ෂණීය වෙළෙඳ දැන්වීමක් සකස් කරන්න.

(ලකුණු 15 යි.)

* * *

297431

OL/2024(2025)/21/S-III

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S III**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

| | | |
|---|---|---|
| **සිංහල භාෂාව හා සාහිත්‍යය** | **III** | **පැය දෙකයි** |
| சிங்களமொழியும் இலக்கியமும் | **III** | *இரண்டு மணித்தியாலம்* |
| Sinhala Language and Literature | **III** | *Two hours* |

**සිංහල භාෂාව හා සාහිත්‍යය III**

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
⁕ **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) නහින දෙහින කාලෙට පින් කෙරුම     යුත
වහින කලට කුරින් විල්වලින්     එත
බහින දියෙන් දෝතක් මුත් ගතොත්     ඇත
පනින රිලවුංට ඉනිමං කමක්     නැත

(අ) මේ පද්‍යය අයත් වන්නේ කුමන ජන කවි වර්ගයට ද?
(ආ) මෙහි සඳහන් කර ඇති නිෂ්ඵල ක්‍රියාව කුමක් ද?

(ii) **ජාතිය රන් විමනක්**     **වේ**
ආගම මිණි පහනක්     වේ
එය රැක ගන්නට මෙ     ලොවේ
සමත් වෙතොත් පුත නුඹ     වේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අන්තර්ගත කාව්‍යාලංකාරය කුමක් ද?
(ආ) කවියා පුතුට රැකගන්නට අවශ්‍ය යැයි යෝජනා කරන්නේ මොනවා ද?

(iii) "පෙරේතයො කෑම කන්නෙ නෑ. කෑමට දිෂ්ටිය හෙළනවා. එහෙම දිෂ්ටිය හෙළපු කෑම කාපුවහම තමයි ලෙඩ වෙන්නෙ."

(අ) මේ ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ නම කුමක් ද?
(ආ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් කාහට ද?

(iv) "අඬල වැඩක් නෑ ළමයා. මං දැන් හොඳට ම වයස මිනිහෙක්. මට වඩා හොඳින් ඔය ගැන දන්න කෙනෙක් තවත් මෙහෙ නෑ"

(අ) මෙහි ළමයා යනුවෙන් හැඳින් වූ අයගේ නම ලියන්න.
(ආ) මේ ප්‍රකාශය කරන තැනැත්තා වඩා හොඳින් ම දැන සිටි කාරණය කුමක් ද?

(v) නොදනිති හසරක් නුපුරුදු එ තිදෙන
පැමිණෙන පිරිපත වළකනු කෙලෙස ද
දිරි ඇති මුත් පුත නරයෙකි ගත මුදු
ලොව දැක නැත අද වන තුරු කිසි කල

(අ) මෙහි **එ තිදෙන** යනුවෙන් හැඳින්වූ අය නම් කරන්න.
(ආ) 'කරදර' යන්නට සමානාර්ථ පදයක් පද්‍ය පාඨයෙන් උපුටා දක්වන්න.

(vi) "සෘද්ධිමත් කෙනකුන් ආකාශයෙන් ගොසින් වදුත් මුත් මිනිසුන් විසින් මේ නුවර වදනා තබා සිතන්නටත් බැරි ය."

(අ) මේ ප්‍රකාශය ශ්‍රවණය කරනු ලැබුයේ කවරකු විසින් ද?
(ආ) මෙහි සඳහන් නුවර හැඳින්වූයේ කුමන නමකින් ද?

[දෙවැනි පිටුව බලන්න.

(vii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද **දෙක** සම්පූර්ණ කරන්න.

රි වි තැ වු ලේ පිපි කමලේ විල් ගැවැසී
ම ත කො වු ලේ තුරු වදලේ හඬන නිසී

(අ) ..........................................................................

(ආ) ..........................................................................

(viii) "මම් පූර්වයෙහි දිවෙන ඇතුන් ලුහුබැඳ ගනිම් මැ යැ. අසුන් ලුහුබැඳ ගනිම් මැ යැ. රථ ලුහුබැඳ ගනිම් මැ යැ. දිවෙන මුවන් ලුහුබැඳ ගනිම් මැ යැ."

(අ) මෙසේ සිතන ලද්දේ කවරකු විසින් ද?

(ආ) මෙසේ සිතන්නට හේතු වූ කරුණ කුමක් ද?

(ix) යොදා සවන් වෙණ නද රස සුලබව
නදා එකග සිත් වත නො ම සකොබව
සදා කුලය නොහැර ම එන අසුබව
එදා ගියේ රිළවුන් සන්සල බව

(අ) මේ පද්‍යය උපුටාගත් කෘතියේ රචකයා නම් කරන්න.

(ආ) රිළවුන්ගේ චංචලභාවය පහව ගියේ කුමක් නිසා ද?

(x) (අ) 'සද්ධර්මරත්නාවලිය' රචනා වී ඇත්තේ කුමන රජු දවස ද?

(ආ) 'සද්ධර්මරත්නාවලිය' රචනා කිරීම සඳහා පාදක කර ගෙන ඇති ග්‍රන්ථයේ නම කුමක් ද?

(ලකුණු 02 × 10 = 20 යි.)

**2.** පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) **සු ර ර ද** සමන් සමගින් සුරංගන එ වර
**පැහැ න ද** මදාරා පරසතු මල් පතර
කැර පු ද වඳින රුදි මුනි සිරි පා තඹර
සකි ස ඳ පෙනේ සමනොළ ගල නැගෙන හිර

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(ආ) කවියා, සැළලිහිණියා අමතා කරන විස්තරය කෙටියෙන් ලියන්න.

(ii) "එක් දවසක් කඹයේ නටන එකකුගේ දුවක් හුණදඬු අගක දී නටන එකක් ශිල්ප බලයෙන් උඩ අහස සක්මනුත් කෙරෙයි; නටයි; ගීත් කියයි. එ දවස් උග්ගසේන නම් සිටුපුත් **යාළණු** කෙනකුන් හා සමග මැස්සක් මත්තෙහි සිට ආස සිට නටන ඒ විද්දත් දුවගේ **හාවභාව ලීලා** දැක වායොධාත්වාධික රූප කලාප විකාරයක් බලවත් නියා ය යි නො සිතා ඈ කෙරෙහි බලවත් වූ ප්‍රෙම ඇති ව 'ලදොත් ජීවත් වෙමී. නො ලදොත් මියෙමී' සිතා ගෙන නො කා නො බී හැඳට නැගී ලා වැද හොත්තාහ."

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම දක්වන්න.

(ආ) විද්දත් දුව කෙරෙහි බැඳුණු උග්ගසේන සිටුපුත් හැසුරුණු ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(iii) තුමුල ගතින් දා
බාහු බෙලෙන් දා
වෙමි සේ තිදසින් දා
කුරිරු **ගිජින්දා**
කුඹු තල සින්දා
ලමි සේ **කෙසරින්දා**
මා පිය මිගිදා කරනා විකුමන්
ඇයි මට බැරි වන්නේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.

(ආ) ඉහත දැක්වෙන උද්ධෘතයේ අර්ථය සරල බසින් ලියන්න.

(iv) "ඒ කේවට්ටාචාරි එක් දවසක් තුමූ අලුයම් වේලෙහි පිබිද, සුවඳ තෙලෙහි නඟන ලද පහන් ආලෝකයෙන් ගන්ධදාම **පුෂ්පදාමාවලම්බිත** නා නා වර්ණ විචිත්‍ර විතානෝපලක්ෂිත අලංකෘත ශ්‍රී යහන් **ගර්භය** බලන්නාහු මහත් වූ සම්පත් දැක, "මේ මාගේ යසස කවුරුන් සන්තක දෝ හෝ' යි සිතන්නාහු 'අනෙක් කෙනෙකුන් සන්තක නො වෙයි; ..."

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.

(ආ) මේ පාඨයේ අදහස සරල බසින් ලියන්න.

(v) දිමුතු යසස් වන් **කුසුම** **සරාගේ**
**නුමුතු** සුවඳ මල් පැලඳ සරාගේ
දකුතු රඟන සුරඟන රඟ ලාගේ
උමතු නො වෙ ද කෙලෙසක සිත කාගේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(ආ) දිව්‍යාංගනාවන් රංගනය සඳහා සැරසී සිටි ආකාරය කවියා විස්තර කර ඇත්තේ කෙසේ ද?

(ලකුණු 04 × 5 = 20 යි.)

**3.** උග්ගසේන සිටුපුත්ගේ තීරණය හමුවේ,

- ඔහුගේ මවුපියන්ගේ ක්‍රියාකලාපයත්
- විද්දත් දුවගේ පියාණන්ගේ ක්‍රියාකලාපයත්

අතර ඇති පරස්පරතාව කථා විකාශනයට මහත් පිටිවහලක් වී ඇති අයුරු 'සද්ධර්මරත්නාවලිය' නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

- පරිසර වර්ණනයේ චමත්කාරයත්
- ශ්‍රද්ධා භක්තිය වඩවන වෙහෙර වැනුමත්

පාඨකයා ආකර්ෂණය කර ගැනීමට හේතු සාධක වී ඇති ආකාරය 'හංස සන්දේශය' නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි.)

**4.**
- කාව්‍යෝක්ති නිර්මාණයේ අපූර්වත්වයත්
- වස්සාන සමයේ දී පරිසරයේ මැවෙන සුන්දරත්වයත්

කැටි වූ අපූර්ව කාව්‍ය නිර්මාණයක් ලෙස 'වස්සානය' පැදිපෙළ අගය කළ හැකි ය.
එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

**නැතහොත්**

- කැලෑ ජීවිතයේ කයෝරත්වයත්
- නූගත්කම නිසා අත් විඳින්නට සිදු වන පීඩාවත්

'බැද්දේගම' නවකතාව මගින් මනා ලෙස නිරූපණය කිරීමට කතුවරයා සමත් ව ඇත.
නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15 යි.)

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

**5.** සාවද්‍ය උපකල්පනයක පිහිටි ගුරුවරයකු තම ගෝලයකු අඳුරේ හෙළීම සඳහා ක්‍රියා කළ ආකාරය 'අමාවතුර' නිර්දිෂ්ට කොටස ඇසුරින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි.)

**6.** සොබා දහමේ විවිධ සංසිද්ධීන් විස්තර කිරීමේ දී උචිත කාව්‍යෝක්ති යොදා ගැනීම 'ගංගාවේ සංගීතය' පැදිපෙළේ සාර්ථකත්වයට හේතු වී ඇත. නිර්දිෂ්ට පැදිපෙළ ඇසුරින් උදාහරණ **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 10 යි.)

**7.** යහපත් ජීවිතයකට අවශ්‍ය මග පෙන්වීම් ලබා දීමට ජන කවියා උත්සුක වී ඇති අයුරු 'හානා හීය පානා අඬහැරෙන් දැනේ' පාඩම ඇසුරින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි.)

❊ ❊ ❊

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)
# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## ලකුණු දීමේ පටිපාටිය

I පත්‍රය - 1 x 40 = ලකුණු 40

II පත්‍රය -

| | | | |
|---|---|---|---|
| 01. ප්‍රශ්නය | - | 2x 10 | = ලකුණු 20 |
| 02. ප්‍රශ්නය | - | | = ලකුණු 25 |
| 03. ප්‍රශ්නය | - | | = ලකුණු 10 |
| 04. ප්‍රශ්නය | - | | = ලකුණු 10 |
| 05. ප්‍රශ්නය | - | | = ලකුණු 15 |
| | | එකතුව | = ලකුණු 80 |

= ලකුණු 80

III පත්‍රය -

| | | | |
|---|---|---|---|
| 01. ප්‍රශ්නය | - | 2 x 10 | = ලකුණු 20 |
| 02. ප්‍රශ්නය | - | 4x 5 | = ලකුණු 20 |
| 03. ප්‍රශ්නය | - | | = ලකුණු 15 |
| 04. ප්‍රශ්නය | - | | = ලකුණු 15 |
| 05. ප්‍රශ්නය<br>06. ප්‍රශ්නය<br>07. ප්‍රශ්නය | } | එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු යි. | = ලකුණු 10 |
| | | එකතුව | = ලකුණු 80 |

= ලකුණු 80

### අවසාන ලකුණු ගණනය කිරීම

| | | |
|---|---|---|
| I පත්‍රයට ලකුණු | = | 40 |
| II පත්‍රයට ලකුණු | = | 80 |
| III පත්‍රයට ලකුණු | = | 80 |
| එකතුව | = | 200 |
| අවසාන ලකුණු | = | 200÷ 2 |
| | = | 100 |

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිත කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) .................................................... √ △ 4/5
....................................................
....................................................

(ii) .................................................... √ △ 3/5
....................................................
....................................................

(iii) .................................................... √ △ 3/5
....................................................
....................................................

(03) එකතුව ➡ □ 10/15

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.
**VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළ දී ගණනය කරනු නො ලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙන ම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විට ම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවක ම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අස්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)

## අභිමතාර්ථ

## I පත්‍රය

## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත වේ. මෙහි දී අපේක්ෂකයන්ගේ අවබෝධය, ස්මරණය, නිරවුල් දැනුම, භාෂා පරිචය හා භාවිතය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂා කෙරේ.

## IIපත්‍රය

මෙය ප්‍රශ්න පහකින් සමන්විත වෙයි.

1 ප්‍රශ්නය. කෙටි උත්තර අපේක්ෂිත ප්‍රශ්න 10කින් යුක්ත වෙයි. මෙහි දී සිංහල භාෂාවේ වචන කෝෂය, ව්‍යාකරණ ආදිය පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ.

2 ප්‍රශ්නය. රචනා ලිවීමේ හැකියාව මැන බලන්නකි. දී ඇති විස්තරවලින් එකක් තෝරා ගෙන ඒ යටතේ රචනාවක් ලිවීමත්, යෝග්‍ය මාතෘකාවක් යෙදීමත් අපේක්ෂා කෙරේ. මෙහි දී අපේක්ෂකයාගේ නිර්මාණ හා චින්තන ශක්තිය, ලේඛන කුසලතාව, නිරවුල් භාෂා භාවිතය, විශ්ලේෂණ හැකියාව මැන බැලීම ආදි අරමුණු කෙරෙහි අවධානය යොමු වෙයි.

3 ප්‍රශ්නය. සාරාංශකරණය යි. දී ඇති ඡේදය සංක්ෂේප කොට ලියා දැක්වීම මෙහි දී අපේක්ෂා කෙරේ. අපේක්ෂකයන්ගේ සංශ්ලේෂණ හැකියාව මෙන් ම භාෂා භාවිතය පිළිබඳ දැනුම ද මෙහි දී පරීක්ෂා කෙරේ.

4 ප්‍රශ්නය. අපේක්ෂකයන්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කෙරෙන්නකි. මේ සඳහා දෙන ලද ඡේදයක් ආශ්‍රයෙන් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. මේ ප්‍රශ්න මනාව අවබෝධ කර ගෙන නිවැරදි පිළිතුරු ලිවීම අපේක්ෂිත යි.

5 ප්‍රශ්නයේ දී අපේක්ෂකයන් විවිධ ප්‍රායෝගික ලේඛන ලිවීමෙහි ලා දක්වන කුසලතාව විමසා බැලේ. මෙහි එක් ප්‍රශ්නයක් වනුයේ වෙළෙඳ දැන්වීමක් සකස් කිරීම යි. එහි ම අනෙක් ප්‍රශ්නය වනුයේ ආරාධනා පත්‍රයක් ලිවීම යි. මෙබඳු ප්‍රශ්න මගින් නූතන සමාජයෙහි භාවිත වන විවිධ ප්‍රායෝගික ලේඛන පිළිබඳ අධ්‍යයනය හා ඒවා සිත් ගන්නා පරිදි ලියා දැක්වීම පිළිබඳ අපේක්ෂකයන්ගේ කුසලතාව විමර්ශනය කෙරේ.

## III පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් සමන්විත වෙයි. 1 ප්‍රශ්නයේ කොටස් දහයකි. මෙහි දී නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය පරීක්ෂා කෙරේ.

2 ප්‍රශ්නය යොමු වන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල විමර්ශනාත්මක අවබෝධය පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමට යි.

3, 4 ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයන්ගේ විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල දැනුම පරීක්ෂා කිරීම සඳහා යොමු වෙයි.

5, 6, 7 ප්‍රශ්නවලින් අපේක්ෂකයන් පිළිතුරු සැපයිය යුත්තේ එකකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිත ව අපේක්ෂකයන් සතු ව පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල දැනුම මැන බැලීම යි.

සමස්තයක් වශයෙන් සැලකීමේ දී සිංහල I, II හා III ප්‍රශ්න පත්‍ර, අපේක්ෂකයන්ගේ භාෂා ඥානය හා සාහිත්‍යාවබෝධය පරීක්ෂා කිරීම සඳහා යොමු වන බව සඳහන් කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**රහස්‍යයි**

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024(2025)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2024(2025)

විෂය අංකය / பாட இலக்கம் **21**

විෂයය / பாடம் **සිංහල භාෂාව හා සාහිත්‍යය I**

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 1 | 31. | 1 |
| 02. | 4 | 12. | 1 | 22. | 2 | 32. | 3 |
| 03. | 1 | 13. | 4 | 23. | 3 | 33. | 3 |
| 04. | 2 | 14. | 3 | 24. | 2 | 34. | 2 |
| 05. | 4 | 15. | 2 | 25. | 1 | 35. | 1 |
| 06. | 1 | 16. | 1 | 26. | 4 | 36. | 2 |
| 07. | 1 | 17. | 2 | 27. | 3 | 37. | 4 |
| 08. | 3 | 18. | 4 | 28. | 1 | 38. | 2 |
| 09. | 4 | 19. | 2 | 29. | 3 | 39. | 1 |
| 10. | 2 | 20. | 4 | 30. | 4 | 40. | 2 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
# II පත්‍රය

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය - භාෂා පරිචය ඇගයීම**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනු ප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනු ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

ඉගෙනුම් පල -

- අඝෝෂ ව්‍යඤ්ජන අක්ෂර හඳුනාගෙන නම් කරයි.
- නාසික්‍ය අක්ෂර හඳුනාගෙන ලියයි.
- අක්ෂර වින්‍යාසය පිළිබඳ රීති අනුගමනය කරමින් ලියයි.
- පොතපත කියවීමෙන් පුළුල් කර ගත් වාක්කෝෂය භාෂා කාර්යයේ දී භාවිත කරයි.
- විවිධ සන්ධි වර්ග හඳුනාගෙන නම් කරයි.
- සම්මත රීති අනුගමනය කරමින් වාක්‍ය ලියයි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු** ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. **කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) **සිංහල අක්ෂරමාලාවේ ඇතුළත්**

(අ) **අඝෝෂ ව්‍යඤ්ජන අක්ෂරයක් ලියා දක්වන්න.**

(ආ) **නාසික්‍ය අක්ෂරයක් ලියා දක්වන්න.**

(අ) ක, ච, ට, ත, ප
ඛ, ඡ, ඨ, ථ, ඵ (ශ, ෂ, ස, ෆ) අඃ

(ආ) ඞ, ඤ, ණ, න, ම

(ii) **පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් තද්ධිත පද දෙකක් ලියන්න.**
**පුරාතන ගොවීන් විසින් වගා කෙරුණු දේශීය වී වර්ග භාවිතයෙන් බොහෝ රෝග සමනය වනු ඇතැයි සමහරු පවසති.**

පුරාතන, දේශීය

(iii) **පහත සඳහන් පද විසන්ධි කරන්න.**
(අ) **පෙරපර** (ආ) **ළිංවතුර**

(අ) පෙර + අපර (ආ) ළිඳ + වතුර

(iv) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.

කථනයේ දී මෙන් ම ලේඛණයේ දී ද වඩාත් රසවත් ව, අර්ථවත් ව අදහස් පළ කිරීම සඳහා සාම්ප්‍රධායික යෙදුම් බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

ලේඛනය/ලේඛනයේ/ සාම්ප්‍රදායික

(v) පහත සඳහන් අනුක්ත පදවල උක්ත රූප ලියා දක්වන්න.

(අ) ඔවුන් (ආ) ශිල්පියකු

(අ) ඔවුහු (ආ) ශිල්පියෙක්

(vi) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) ආගමන (ආ) අනර්ථවත්

(අ) විගමන (ආ) අර්ථවත්

(vii) පහත සඳහන් වාක්‍යවල **තද කළු අකුරින් මුද්‍රිත** පද අයත් වන සන්ධි පද ප්‍රවර්ගය නම් කරන්න.

(අ) **බුත්සරණ** පොලොන්නරු අවධියට අයත් කෘතියකි.

(ආ) **පිළිතුරු** පත් ඇගයීම විධිමත් කරන ලෙස විදුහල්පතිතුමා දැනුම් දුන්නේ ය.

(අ) බුත්සරණ බුදු + සරණ - ගාත්‍රාදේශ සන්ධිය

(ආ) පිළිතුරු පිළි + උතුරු - පරස්වර ලෝප සන්ධිය

(viii) පහත සඳහන් වාක්‍යයේ අන්තර්ගත වන නිපාත පද **දෙකක්** ලියා දක්වන්න.

ශිෂ්‍යයන් මෙන් ම ගුරුවරු ද අධ්‍යයන කටයුතුවල යෙදෙති.

මෙන් , ම, ද

(ix) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) දරුවන් ගුරුවරු නමදිති.

(ආ) විනිසුරුවරයාත් නීතිඥවරුත් උසාවියට යයි.

(අ) දරුවෝ ගුරුවරුන් නමදිති.

(ආ) විනිසුරුවරයාත් නීතිඥවරුත් උසාවියට යති.

(x) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) චිත්‍රපට අධ්‍යක්ෂවරයා නළුවන් හසුරුවයි.

(ආ) ශිෂ්‍යයෝ චාරිකාවක් සංවිධානය කරති.

(අ) චිත්‍රපට අධ්‍යක්ෂවරයා විසින් නළුවෝ හසුරුවනු ලබති./ලැබෙති./ලබත්/ලැබෙත්/ හැසිරවෙති./හැසිරවෙත්.

(ආ) ශිෂ්‍යයන් විසින් චාරිකාවක් සංවිධානය කෙරෙයි./කෙරේ. කරනු ලබයි./ලැබෙයි./ලැබේ.

**ප්‍රශ්න අංකය 02**

අපේක්ෂණය - විශ්ලේෂණ හැකියාව මැනීම

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් ලිවීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරෙන් වටහා ගත යුතු ය. රචනයෙහි අන්තර්ගත විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකි ය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරෙන් අපේක්ෂකයා මාතෘකාව සකස් කර ගත යුතු ය.

ඉගෙනුම් පල -

- රචනා මාතෘකාවට අදාළ ව කරුණු රැස් කරයි.
- රැස් කර ගත් කරුණු තර්කානුකූල ව පෙළගස්වයි.
- ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් රචනා ලියයි.
- නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

**2.** පහත දැක්වෙන **(අ)**, **(ආ)**, **(ඉ)**, **(ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. **රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.**

**(අ)** **නිදහසේ මාධ්‍ය හැසිරවීමට අවකාශ ලැබීම යනු අසත්‍ය තොරතුරු සමාජගත කිරීමට ලැබෙන අවස්ථාවක් නොවේ. දෙස් විදෙස් තොරතුරු සමබරතාවකින් යුතු ව සමාජය වෙත සමීප කරවීම මාධ්‍යවල වගකීමයි. ඇතැම් ජනමාධ්‍ය මෙන් ම සමාජ මාධ්‍ය ද මේ කරුණු හරිහැටි වටහා ගෙන නොමැති බව වර්තමානයේ දක්නට ලැබේ. අසත්‍ය ප්‍රවෘත්ති මාධ්‍ය මගින් මුදා හැරීම මිනිස් සමාජය ප්‍රචණ්ඩත්වය කරා ගෙන යන දොරගුළු විවර කිරීමක් ද වනු ඇත. මේ නිසා මාධ්‍ය සදාචාරය පිළිබඳ නිසි වැටහීමකින් යුතු ව මාධ්‍යකරණයේ යෙදීමට මාධ්‍යකරුවන් වග බලා ගත යුතු ය.**

- සදාචාරාත්මක මාධ්‍යකරණයේ වැදගත්කම
- නිදහස් හා සාදාචාරාත්මක ජන මාධ්‍යවල වගකීම
- මාධ්‍ය සාදාචාරය සුරැකීම ජනමාධ්‍යවල වගකීම යි

**(ආ)** **විදේශ විනිමය ඉපැයිය හැකි එක් ප්‍රධාන මාර්ගයක් ලෙස සංචාරක කර්මාන්තය මුල් තැනක් ගනියි. මේ බව වටහා ගත් බොහෝ රටවල් සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. සුහදශීලී, සංග්‍රහශීලී සහ ආචාරශීලී ජනතාවක් වෙසෙන, ස්වභාව සෞන්දර්යයෙන් අනූන සුන්දර පාරාදීසයක් වන ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ද ප්‍රසිද්ධ ව ඇති බැවින් සංචාරක කර්මාන්තය තවදුරටත් නගා සිටුවීමට කඩිනම් පියවර ගැනීමේ අවශ්‍යතාව කෙරෙහි බලධාරීන්ගේ අවධානය යොමු විය යුතු ය.**

- විදේශ විනිමය ප්‍රවර්ධනය සඳහා සංචාරක කර්මාන්තය යොදා ගැනීම
- ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ ප්‍රවණතා
- සංචාරක ආකර්ෂණයට ගත මැකි ක්‍රියාමාර්ග

**(ඉ)** **දිවයිනේ බොහෝ ප්‍රදේශවල වී ගොවිතැන සහ එළවළු වගාව මහා පරිමාණයෙන් සිදු වන අයුරු දිස්වන නමුත් පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වන අවස්ථා මෙන් ම මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළ යන අවස්ථා ද දක්නට ලැබේ. අතරමැදියන් නිසා ගොවීන්ට නිසි මිලක් නොලැබෙන අතර ම පාරිභෝගිකයන්ට වැඩි මිලක් ගෙවා ආහාර අවශ්‍යතා සපුරා ගැනීමට සිදු වී ඇත. මේ අතර එළවළු ප්‍රවාහනයේ දී සිදු වන අධික නාස්තිය ද සැලකිලිමත් විය යුතු කරුණකි. භෝග වගා කිරීමේ නිසි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විය යුතු අතර ම ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ද දැඩි අවධානයක් යොමු කිරීම කාලෝචිත වේ.**

- ආහාර සුරක්ෂිතතාව කෙරෙහි අවධානය යොමු කිරීම
- ආහාර නාස්තිය අවම කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග
- භෝග වගා කිරීමේ දී නිසි යාන්ත්‍රණයක අවශ්‍යතාව
- භෝග වගා කිරීමේ දී හා ප්‍රවාහනයේ දී ඇති වන දුෂ්කරතා

**(ඊ)** **මිනිසාට මෙන් ම රටකට ද තම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා තාක්ෂණය අත්‍යවශ්‍ය සාධකයකි. තාක්ෂණය නිසි පරිදි හසුරුවාලීම මඟින් විවිධ රටවල් තම අනාගත ඉලක්ක ජයගෙන ඇති ආකාරය පුදුම සහගත ය. ඉන් ප්‍රධාන අවස්ථාවක් ලෙස කෘත්‍රිම බුද්ධිය යොදා ගැනීම දැක්විය හැකි ය. මිනිස් මොළය වෙහෙසා කළ යුතු කාර්යයන් සඳහා ඉතා සුළු වේලාවක් තුළ නිශ්චිත විසඳුම් ලබා දීමට කෘත්‍රිම බුද්ධිය සමත් වී ඇත. නවීන තාක්ෂණය මිනිසාගෙන් ඔබ්බට ගමන් කරන ආකාරයක් දිස්වන අතර ම එය මිනිසා අබිබවා යන දිනය වැඩි ඈතක නොවන අයුරක් ද විද්‍යමාන වේ.**

**(ලකුණු 25 යි.)**

- මිනිසා අබිබවා යන නවීන තාක්ෂණය
- මිනිසා අකර්මණ්‍ය කිරීම කෙරෙහි නවීන තාක්ෂණය බලපාන අයුරු
- නවීන තාක්ෂණය වඩාත් ඵලදායි ලෙස යොදා ගැනීම

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි.**

| | | |
|---|---|---|
| 01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව | - | ලකුණු 08 යි. |
| 02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | - | ලකුණු 12 යි. |
| 03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05 යි. |

01. සාරවත්භාවය - ලකුණු 07 යි.
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි.

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යූහයට සමීපබව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශනය, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.
වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ **සැලකිය යුතු යි.**

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට ආනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.
02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (x) ලකුණු යොදන්න.
03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.

1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්‍ෂය - ★ වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යූහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යූහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

රචනය දුර්වල වුවත් මුළු ලකුණු වශයෙන් බින්දුව නො දෙන්න. සමස්තයක් ලෙස සලකා ලකුණු 02 - 05 අතර සංඛ්‍යාවක් පිරිනමන්න. උපරිම ලකුණු 05 ඉක්මවිය යුතු නො වේ.

සාරවත්භාවය මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08

| | |
|---|---|
| මාතෘකාව ද සහිත ව සාරවත් කරුණු ප්‍රමාණවත් ව ඉදිරිපත් කිරීම, මාතෘකාව රචනාවට ගැළපෙන බව, මනා භාෂා භාවිතය, තේමාවට අදාළ ව ලියා තිබීම, සරුබව හා සමබව නිවැරදි ව රැක තිබීම, වචන 250ට සමීප ව පැවතීම. | 8-7 |
| සාරවත් කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කිරීම, මාතෘකාව ද රචනාවට ගැළපෙන පරිදි යොදා තිබීම, භාෂා ශෛලිය තරමක් හොඳින් පැවතීම, තේමාවට අදාළ බව තරමක් දුරස්වීම, සමබවෙහි හා සරුබවෙහි තරමක් දුර්වලතා පැවතීම, වචන ගණන 200ට වඩා අඩුවීම. | 6-5 |
| සාරවත් කරුණු ප්‍රමාණවත් පරිදි නොතිබීම, භාෂා ශෛලියේ දුර්වලතා පැවතීම, තේමාවට අදාළ නොවීම, මාතෘකාවක් යොදා තිබීම, සරුබව හා සමබව නොපැවතීම, වචන ගණන 200ට අඩුවීම. | ලකුණු 4ට අඩු |

සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12

| | |
|---|---|
| උසස් ප්‍රකාශන ශක්තිය, මැනවින් කරුණු සංවිධානය කර තිබීම, ස්වීයත්වය ප්‍රදර්ශනය කිරීම, නිර්මාණාත්මක ව ලියා තිබීම, නිරවුල් බව, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම. | 12-10 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානයේ දී දුර්වලතා තරමක් පැවතීම. | 9-7 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානය කර ගැනීමේ දී දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වයෙහි ගැටලු දක්නට ලැබීම,<br>නිර්මාණාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමේ ගැටලු පැවතීම,<br>භාෂා ව්‍යවහාරයෙහි දුර්වලතා පැවතීම. | 6-4 |
| ප්‍රකාශන ශක්තියෙහි බොහෝ දුර්වලතා පැවතීම<br>කරුණු සංවිධානය කර ගැනීමේ දී බොහෝ දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වය ප්‍රදර්ශනය නොකිරීම,<br>නිර්මාණාත්මකභාවය දක්නට නොලැබීම,<br>නිරවුල් නොමැතිවීම,<br>භාෂා ව්‍යවහාරයේ බොහෝ දුර්වලතා පැවතීම. | 3-1 |

ශිල්පීය දක්ෂතා - ලකුණු 05

| | |
|---|---|
| ව්‍යාකරණ රීති නිවැරදි ව අනුගමනය කර තිබීම,<br>පැහැදිලි අත්අකුරු භාවිත කිරීම,<br>විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම,<br>නිවැරදි ඡේද වෙන් කිරීම,<br>අක්ෂර වින්‍යාස රීති භාවිතය. | 5 |
| ව්‍යාකරණ දෝෂ, අපැහැදිලි අත්අකුරු, විරාම ලක්ෂණමය දෝෂ, අක්ෂර දෝෂ තරමක් පැවතීම. | 4-3 |
| ඉහත දෝෂ බහුල වීම. | 1 |

**ප්‍රශ්න අංකය 03**

**අපේක්ෂණය** - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. ඒ අනුව සංශ්ලේෂණ හැකියාව මෙහි ලා විමසීමට ලක් කෙරේ.

ඉගෙනුම් පල -

- ලිපි ලේඛනවලින් වැදගත් කරුණු වෙන් කොට දක්වයි.
- වැදගත් කරුණු අර්ථවත් ව ගළපා ඉදිරිපත් කරයි.
- මුල් ලේඛනයේ අදහස් ආරක්ෂා වන පරිදි සාරාංශ කර දක්වයි.

**3.** පහත දැක්වෙන පාඨය වචන **60 - 70** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

අහස, පොළොව, ජලය, සුළඟ හා ස්වාභාවික පරිසරය ද මිනිසාගේ පැවැත්මට බාධා ගෙන දෙමින් විපරීත තත්ත්වයට පත් ව ඇත්තේ ය. හඳුනාගත නොහැකි බොහෝ ලෙඩ රෝග වැලඳීමටත් ස්වභාවධර්මය අකාරුණික ලෙසට මිනිසාට එරෙහි ව නැගී සිටීමටත් පටන් ගෙන ඇති බවක් පෙනෙන්නට තිබේ. මෙම අකාරුණික තත්ත්වයට වගකිව යුත්තේ අන් කිසිවකු නොව මිනිසා ම ය. මිනිසාගේ දිවි පැවැත්මට හා ඉදිරි ගමනට ආධාර උපකාර කළ ස්වභාවධර්මයට මිනිසා අකාරුණික වීම මෙම ව්‍යසනවලට එක් හේතුවකි. අප අවට ඇති බොහෝ ස්වාභාවික මෙන් ම භෞතික වස්තූන් ද මිනිසා විසින් මිනිසාට එරෙහි ව නිපදවා ඇති බොහෝ විනාශකාරී දේ ද අද මිනිසාට විශාල ගැටලුවක් ඇති කර තිබේ. මෙම තත්ත්වය තවමත් අප තේරුම් ගෙන නොමැත. මේ නිසා වර්තමානයේ ජීවත් වන ජනතාවට නැවත වරක් ආපසු හැරී බලන්නට සිදු වී ඇත. අනාගත ලෝකය වඩාත් යහපත් තැනක් බවට පත් කිරීමේ මෙහෙයුම දියත් කිරීම කඩිනමින් ආරම්භ කළ යුතු වන්නේ මේ වන විටත් සොබාදහම සහ අප ජීවත් වන අවට පරිසරය විශාල සෝදා පාළුවකට, විපතකට හා විනාශයකට පත් ව ඇති නිසා ය. සදාචාරාත්මක යයි ගැනෙන සියලු දේ පිරිහීමට ලක් ව ඇත්තේ ය. එමෙන් ම ශිෂ්ටාචාරය විසින් අපට උරුම කළ බොහෝ දේත් ස්වභාවයෙන් ම අපට ලැබුණු ලෙඩ රෝගවලින් වැළැකීමේ ශක්තියත් කායික-මානසික සුවතාවත් විනාශ වී ගොස් ය. මෙම තත්ත්වය ඉදිරියේ දී තව තවත් වර්ධනය වීමට ඇති ඉඩකඩ අතිවිශාල ය.

(ලකුණු 10 යි.)

- සොබාදහම මිනිසාගේ පැවැත්මට බාධා ඇති වන ලෙස විපරීත තත්ත්වට පත්ව ඇත.
- මිනිසාගේ ක්‍රියාකාරකම්වලින් සොබාදහම ආකාරුණික වී ඇත.
- එහි ප්‍රතිඵල මිනිසාට භුක්ති විඳීමට සිදු ව ඇත.
- ස්වාභාවික හා භෞතික වස්තූන් ද මිනිසා විසින් නිර්මිත විනාශකාරී දේ ද මිනිසාගේ විනාශයට හේතු වී තිබේ.
- අනාගත ලෝකය යහපත් කිරීමට කඩිනමින් විය යුත්තේ සොබා දහම හා පරිසරය විනාශ වීම වැළැක්වීම යි.
- ශිෂ්ටාචාරයෙන් අපට උරුම බොහෝ දේත් ප්‍රතිශක්තීකරණයත් කායික මානසික සුවතාවත් විනාශ වී ඇත.

**සාරාංශකරණය:**

**මුළු ලකුණු ප්‍රමාණය 10 යි.**

**ලකුණු විග්‍රහය:**

01. අන්තර්ගතය - ලකුණු 06 යි.
02. වචන ගණන - ලකුණු 02 යි.
03. ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි.

* වචන ගණන 75 ඉක්මවන කල්හි මුල් වචන 70 පමණක් ඇගයීමට ලක් කරන්න.
* වචන ගණන 55ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.
* ඡේද බෙදා තිබුණහොත් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.
* එක යට එක අසම්බන්ධිත වාක්‍ය ලෙස ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02කි.
* වචන ගණන 75ට වැඩි කල්හි හෝ 55ට අඩු කල්හි ලකුණක් අඩු කරන්න.
* දුර්වල සාරාංශ සඳහා බින්දුව නො දී ලකුණු 03ක උපරිමයකට යටත් ව ලකුණු පිරිනමන්න.

සාරාංශයේ අන්තර්ගතය සඳහා ලකුණු පිරිනැමීම - ලකුණු 06

| | |
|---|---|
| ප්‍රධාන කරුණු ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම, නිරවුල් ව කරුණු ඉදිරිපත් කිරීම, වචන ගණන අදාළ සීමාව තුළ පැවතීම. | ලකුණු 05-06 |
| ප්‍රධාන කරුණු කිහිපයක් පමණක් ඇතුළත් වීම, වාක්‍ය අතර සම්බන්ධතාව තරමක් රැක ගැනීම, වචන ගණන 55-65 අතර පැවතීම, නිරවුල්බව රැකගැනීම. | ලකුණු 03-04 |
| ප්‍රධාන කරුණු ස්වල්පයක්වත් ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ගිලිහී තිබීම, වචන ගණන 55ට අඩු වීම, නිරවුල් බව ගිලිහී තිබීම. | ලකුණු 01-02 |

**ප්‍රශ්න අංකය 04**
**අපේක්ෂණය** - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධය පිළිබඳ හැකියාව මැනීම

ඉගෙනුම් පල -

- අවබෝධයෙන් යුතු ව පොත පත කියවයි.
- කියවා අවබෝධ කර ගත් කරුණු ඉදිරිපත් කරයි.

4. පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට **පිළිතුරු** සපයන්න.

වැව, මුළු ගම්වැසියන්ට පොදුවේ අයිති ව තිබුණ ද, එයින් ජලය ලැබූ පෙදෙස, ප්‍රමාණයත් අස්වැන්නත් අතින් එකිනෙකට වෙනස් වූ කොටස්වලට බෙදා තිබුණි. එහෙත්, ජලය අපතේ යැම වළක්වනු සඳහා සී සෑමත් කුඹුරුවලට වතුර ඇරීමත් නියම පිළිවෙළකට කළ යුතු විය. කුඹුරු වගා කිරීම පිළිබඳ මේ ආදි කටයුතු පාලනය කිරීම පිණිස 'වෙල්කැමි' ආදි නම් ඇති නිලධාරීන් සිටි බව නවවැනි, දසවැනි සියවස්වලට අයත් සෙල්ලිපිවලින් පෙනෙයි. සී සෑම් ආදි වැඩවල දී මේ නීතිරීති අනුගමනය නොකළ ගොවීන්ට දඩ ගසන ලදි. තමන්ගේ කුඹුරු කොටස් නියම කාලයේ දී වගා කිරීම අතපසු කළ ගොවීන්ට ද දඩ ගසන ලදි. නියම වාරයේ දී ජලය සැපයීම සහ සී සෑම පිළිබඳ ප්‍රශ්න පමණක් නොව, ඒ ඒ කුඹුරුවල වැපිරිය යුතු වී වර්ගය කුමක් ද යන්න තීරණය කර ගැනීමට පවා ඒ ඒ ගොවියාට ඉඩ තිබුණේ නැත. තිසා වැවෙන් ජලය සපයනු ලබන, ඉසුරුමුණි වෙහෙරට අයත් කුඹුරුවල සිහිනැටි (හීනැටි) වැපිරිය යුතු බව ඒ වැවෙන් ජලය බෙදා හැරීම පිළිබඳ නීතිරීති ඇතුළත් කර IV මහින්ද රජු පිහිට වූ සෙල්ලිපියේ කියා තිබේ. හේන් ගොවිතැන් කරනු ලැබූ ඉඩම් ගැන සෙල්ලිපිවල සඳහන් වන කරුණුවලින් පෙනෙන්නේ දසවැනි සියවසේ දී ඒ ඒ ධාන්‍ය වර්ග වැපිරිය යුතු ඉඩම් යායවල් මේ මේවා යයි රජයෙන් නියම කර තිබුණු බවයි.

නවවැනි සහ දසවැනි සියවස්වල දී ගොවිතැන් කරන ලද්දේ එක්තරා සැලැස්මක් ඇති ව බව මෙයින් පෙනෙයි. රටවැසියන්ගේ ජීවිතය සඳහා අවශ්‍ය ද්‍රව්‍යවලින් සමහර ඒවා හිඟ වීමටත්, සමහර ඒවා වැඩියෙන් නිෂ්පාදනය කිරීමටත් ඉඩ නො තබා අවශ්‍ය ප්‍රමාණයට නිෂ්පාදනය කිරීම එහි අදහස විය. සියලු රටවැසියන්ගේ යහපත සඳහා උවමනා තරමට ගොවියාගේ නිදහස මෙපරිද්දෙන් සීමාකර තිබුණේ ය. ඉඩම්වල වගා කරන ලද භෝග ජාති අතින් හෝ සාමාන්‍යයෙන් කෘෂි අර්ථක්‍රමය අතින් හෝ මේ යුගයේ තත්ත්වයත්, මීට පෙර යුගයේ තත්ත්වයත් අතර වැදගත් වෙනසක් නො වී ය. තමා විසින් නිපදවන ලද අස්වැන්නෙන් එක්තරා කොටසක් කිසියම් ආරාමයකට හෝ උසස් නිලධාරියෙකුට හෝ රාජවල්ලභයෙකුට හෝ ආරෝග්‍යශාලා ආදි පුණ්‍යායතනයකට හෝ ගෙවීමට සෑම ගොවියෙකුට ම පාහේ සිදු විය. තව ද අස්වැන්නෙන් නියමිත කොටසක් දියබද්ද වශයෙන් දීමට ද ගොවියාට සිදු විය. වත්තේ හෝ හේනේ වවන ලද ද්‍රව්‍යවලිනුත්, එහි දී ලබාගත් පස්ගෝරසවලිනුත් කිසියම් නියමිත කොටසක් ඉඩම් හිමියාට දීමට සිදු විය. එහෙත්, මේවා පිළිබඳ විස්තර දැන ගන්නට නැත. රටේ එක් ප්‍රදේශයක පිළිවෙළ වෙනත් ප්‍රදේශයක පිළිවෙළට වඩා වෙනස් වූ බව පෙනෙයි.

(i) ජලය අපතේ යැම වැළැක්වීම සඳහා අනුගමනය කෙරුණු ක්‍රියාමාර්ග **දෙක** මොනවා ද?

සී සෑම, කුඹුරුවලට වතුර ඇරීම නියම පිළිවෙළකට කිරීම

(ii) ගොවීන් දඩ ගැසීමට ලක් වූයේ කිනම් කාරණා සම්බන්ධයෙන් ද?

සී සෑම් ආදී කටයුතුවල දී අදාළ නීති රීති අනුගමනය නොකිරීම
තමන්ගේ කුඹුරු කොටස් නියම කාලයේ දී වගා කිරීම අතපසු කිරීම

(iii) ඉසුරුමුණි වෙහෙරට අයත් කුඹුරුවල වැපිරිය යුතු වී වර්ග පිළිබඳ ව සඳහන් වන මූලාශ්‍රය කුමක් ද?

IV වන මහින්ද රජු පිහිට වූ සෙල්ලිපිය

(iv) නවවැනි හා දසවැනි සියවස්වල දී සැලැස්මක් ඇති ව ගොවිතැන් කටයුතු සිදු කිරීමෙන් අදහස් කරන ලද්දේ කුමක් ද?

හිඟ වීමටත් / වැඩි වීමටත් ඉඩ නොතබා අවශ්‍ය ප්‍රමාණයට නිෂ්පාදනය කිරීම
(අවශ්‍ය ප්‍රමාණයට නිෂ්පාදනය කිරීම යන්න පමණක් තිබුණ ද ලකුණු දෙන්න.)

(v) ගොවියාගෙන් ඉඩම් හිමියාට ලැබුණේ මොනවා ද?

වත්තේ හෝ හේනේ වවන ලද ද්‍රව්‍යවලින් හා එහි දී ලබාගත් පස්ගෝරසවලින් කිසියම් නියමිත කොටසක්

**ප්‍රශ්න අංකය 05**

**අපේක්ෂණය** - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම

ඉගෙනුම් පල -

- ප්‍රායෝගික ලේඛනයේ දී ශිල්පීය උපක්‍රම අනුගමනය කරයි.
- අවශ්‍යතා අනුව විවිධ ප්‍රායෝගික ලේඛන සකස් කරයි.

5.
- පනාතැන්න සහ බෝදාගම නගරය යා කරමින් ගඟ හරහා ඉදිකර ඇති මගී පාලම අබලන් තත්ත්වයක පැවතීම
- දැනට පාරු සේවයක් ආරම්භ කර ඇතත් එදිනෙදා විවිධ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට නගරයට යන්නන් සඳහා එය ප්‍රමාණවත් නොවීම
- ගමේ සිට නගරය දක්වා ඇති කිලෝමීටර තුනක් පමණ වූ මහාමාර්ගය ද අබලන් වී ඇති බැවින් බස්රථයක් ධාවනය නොවීම

ඉහත කරුණු යටතේ මගීන්ට අත්විඳීමට සිදු ව ඇති දුෂ්කරතා විස්තර කරමින් පාලම කඩිනමින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලා නගර සභාවේ නගරාධිපති වෙත යැවීම සඳහා සුදුසු රාජකාරි ලිපියක් ලියන්න.
(ඔබ පනාතැන්න ග්‍රාමෝදය සමිතියේ ලේකම් අරුණ ජයමහ යැයි සිතන්න.)

**නැතහොත්**

අංක 360, නවනගරය, බෝදාගම පිහිටි, මුළුතැන්ගෙයි උපකරණ සහ විදුලි උපකරණ ආනයනය කර බෙදා හරින පෞද්ගලික සමාගමක් වන X - ලංකා ආයතනය සිය වෙළෙඳ ජාලය පුළුල් කිරීමේ අරමුණින් පාරිභෝගිකයන්ට සහන රාශියක් හඳුන්වා දීමට අපේක්ෂා කරයි.

- භාණ්ඩ මිල දී ගැනීමේ දී වාරික මගින් ගෙවීමේ පහසුකම්
- මිල දී ගන්නා භාණ්ඩවල වටිනාකම අනුව 5% - 15% දක්වා විශේෂ වට්ටම්
- තමාට අවශ්‍ය භාණ්ඩ නිවසට ම ගෙන්වා ගැනීමේ පහසුකම්
- භාණ්ඩ සඳහා වසර දෙකක වගකීමක්
- අලෙවියෙන් පසු සේවාව

මේ කරුණු ඇතුළත් කරමින් පුවත්පතක පළ කිරීමට සුදුසු ආකර්ෂණීය වෙළෙඳ දැන්වීමක් සකස් කරන්න.
(ලකුණු 15 යි.)

**රාජකාරී ලිපිය**

**ලකුණු විග්‍රහය මුළු ලකුණු - 15 යි.**

1. ආකෘතිය - ලකුණු 04 යි.
2. අන්තර්ගතය - ලකුණු 08 යි.
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.

**1. ආකෘතිය - ලකුණු 04 යි.**

1. යවන්නාගේ නම සහ ලිපිනය - ලකුණු 01 යි.
2. ලබන්නාගේ නම සහ ලිපිනය - ලකුණු 01 යි.
3. මාතෘකාව - ලකුණු 01 යි.
4. අත්සන සහ දිනය - ලකුණු 01 යි.

**2. අන්තර්ගතය - ලකුණු 08 යි.**

1. පනාතැන්න සහ බෝදාගම නගරය යා කරන පාලම අබලන් තත්ත්වයක පවතින බව ලකුණු 01 යි.
2. දැනට පාරු සේවයක් ඇති බව ලකුණු 01 යි.
3. එම පාරු සේවය මගී අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් නොවන බව ලකුණු 01 යි.
4. ගමේ සිට නගරයට ඇති කි.මී. 3ක මාර්ගය අබලන් වී තිබීම ලකුණු 01 යි.
5. එබැවින් බස් රථයක් ධාවනය නොවීම ලකුණු 01 යි.
6. මගීන්ට අත් විඳීමට සිදු ව ඇති දුෂ්කරතා ලකුණු 02 යි.
8. පාලම පිළිසකර කර දෙන ලෙස කරන ඉල්ලීම ලකුණු 01 යි.

**3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- * නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් දෙන්න.

- * නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිම ලකුණු ගණන 03කි.

**නැතහොත්,**

**වෙළෙඳ දැන්වීම**

**ලකුණු විග්‍රහය**

1. ආකෘතිය - ලකුණු 04යි
2. අන්තර්ගතය - ලකුණු 08යි
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03යි

**1. ආකෘතිය - ලකුණු 04 යි**

i. ආකර්ෂණීය මාතෘකාව - ලකුණු 01 යි
ii. පළකරන්නා / ආයතනය - ලකුණු 01 යි
iii. නිර්මාණශීලීත්වය (අකුරුවල ප්‍රමාණය, අකුරුවල හැඩතල, අකුරු වර්ණ ගැන්වීම ආදිය පිළිබඳව ද අවධානය යොමු කරන්න.) - ලකුණු 02 යි

**2 අන්තර්ගතය - ලකුණු 08 යි**

i. පිහිටි ස්ථානය/ ප්‍රදේශය - ලකුණු 01 යි
ii. මුළුතැන් ගෙයි උපකරණ සහ විදුලි උපකරණ ආනයනය කර බෙදා හරින පුද්ගලික සමාගමක් බව - ලකුණු 01 යි
iii. අරමුණ වෙළෙඳ ජාලය පුළුල් කිරීම බව - ලකුණු 01 යි.
iv භාණ්ඩ මිලදී ගැනීමේ දී වාරික මගින් ගෙවීමේ පහසුකම් - ලකුණු 01 යි
v මිලදී ගන්නා භාණ්ඩවල වටිනාකම අනුව 5% සිට 15% දක්වා විශේෂ වට්ටම් හිමි වන බව - ලකුණු 01 යි
vi භාණ්ඩ සඳහා වසර දෙකක වගකීමක් ඇති බව - ලකුණු 01 යි
vii අලෙවියෙන් පසු සේවාව ලැබෙන බව - ලකුණු 01 යි
viii තමාට අවශ්‍ය භාණ්ඩ නිවසට ගෙන්වා ගැනීමේ පහසුකම් ලැබෙන බව - ලකුණු 01 යි

03. **ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- * ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් පිරිනමන්න.
- * නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිම ලකුණු ගණන 03කි.

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
# III පත්‍රය

❖ **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.**
❖ **1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.**

**මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය** - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ඉගෙනුම් පල -

- නිර්දිෂ්ට කෘති ලියැවුණු කාලය හා කතුවරයා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට කෘති නිර්මාණය කළ කතුවරුන්ගේ වෙනත් කෘති නම් කරයි.
- නිර්දිෂ්ට කෘතිවල කතුවරුන්ගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි.

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20 යි.**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) නහින දෙහින කාලෙට පින් කෙරුම යුත
වහින කලට කුරින් විල්වලින් එත
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
පනින රිලවුංට ඉනිමං කමක් නැත

(අ) මේ පද්‍යය අයත් වන්නේ කුමන ජන කවි වර්ගයට ද?
(ආ) මෙහි සඳහන් කර ඇති නිෂ්ඵල ක්‍රියාව කුමක් ද?

(අ) උපදේශනාත්මක ජනකවි/ දැනමුතුකමට කී කවි

(ආ) පනින රිලවුංට ඉනිමං බැඳීම

**(ii) ජාතිය රන් විමනක් වේ**
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙ ලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

**(අ)** තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අන්තර්ගත කාව්‍යාලංකාරය කුමක් ද?
**(ආ)** කවියා පුතුට රැකගන්නට අවශ්‍ය යැයි යෝජනා කරන්නේ මොනවා ද?

(අ) රූපකාලංකාරය

(ආ) ජාතිය හා ආගම

(iii) "පෙරේතයො කෑම කන්නෙ නෑ. කෑමට දිෂ්ටිය හෙළනව. එහෙම දිෂ්ටිය හෙළපු කෑම කාපුවහම තමයි ලෙඩ වෙන්නෙ."

**(අ)** මේ ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ නම කුමක් ද?

**(ආ)** මේ ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් කාහට ද?

(අ) අපට වැසිකිළියක් (නොනිම් සිත්තම හා තවත් කෙටි කතා)

(ආ) කථකයාගේ මව/ අම්මා විසින්, කථකයාට

(iv) "අඬල වැඩක් නෑ ළමයා. මං දැන් හොඳට ම වයස මිනිහෙක්. මට වඩා හොඳින් ඔය ගැන දන්න කෙනෙක් තවත් මෙහෙ නෑ"

**(අ)** මෙහි ළමයා යනුවෙන් හැඳින් වූ අයගේ නම ලියන්න.

**(ආ)** මේ ප්‍රකාශය කරන තැනැත්තා වඩා හොඳින් ම දැන සිටි කාරණය කුමක් ද?

(අ) පුංචි මැණිකා

(ආ) හිර ගෙදරට ගිය කෙනකු ආපහු නො ආ බව

(v) නොදනිති හසරක් නුපුරුදූ එ තිදෙන
පැමිණෙන පිරිපත වළකනු කෙලෙස ද
දිරි ඇති මුත් පුත තරයෙකි ගත මුදූ
ලොව දැක නැක අද වන තුරු කිසි කල

**(අ)** මෙහි **එ තිදෙන** යනුවෙන් හැඳින්වූ අය නම් කරන්න.

**(ආ)** 'කරදර' යන්නට සමානාර්ථ පදයක් පද්‍ය පාඨයෙන් උපුටා දක්වන්න.

(අ) සුප්පා දේවී, සිංහබාහු, සිංහ සීවලී

(ආ) පිරිපත

(vi) "සෘද්ධිමත් කෙනකුන් ආකාශයෙන් ගොසින් වඳුත් මුත් මිනිසුන් විසින් මේ නුවර වදනා තබා සිතන්නටත් බැරි ය."

**(අ)** මේ ප්‍රකාශය ශ්‍රවණය කරනු ලැබූයේ කවරකු විසින් ද?

**(ආ)** මෙහි සඳහන් නුවර හැඳින්වූයේ කුමන නමකින් ද?

(අ) චූලනී බ්‍රහ්මදත්ත රජතුමා

(ආ) මිථිලා නුවර/ මියුලු නුවර/ වෛදේහ රාජ්‍යය

(vii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

රි වි තැ වු ලේ පිපි කමලේ විල් ගැවැසී
ම ත කො වු ලේ තුරු වදලේ හඬන නිසී

**(අ)** ..............................................................................

**(ආ)** ..............................................................................

(අ) වන සැවුලේ මඟ අසලේ පොර සැලැසී

(ආ) ගුරු බැවුලේ යව අවුලේ නොවී කිසී

(viii) "මම පූර්වයෙහි දිවෙන ඇතුන් ලුහුබැඳ ගතිම් මැ යැ. අසුන් ලුහුබැඳ ගතිම් මැ යැ. රථ ලුහුබැඳ ගතිම් මැ යැ. දිවෙන මුවන් ලුහුබැඳ ගනිම් මැ යැ."

(අ) මෙසේ සිතන ලද්දේ කවරකු විසින් ද?

(ආ) මෙසේ සිතන්නට හේතු වූ කරුණ කුමක් ද?

(අ) අඟුල්මල්/ අංගුලිමාල සොරා

(ආ) පියවි ගමනින් වඩිනා බුදුන් වහන්සේ ලුහු බැඳ ගැනීමට / හඹා යාමට නොහැකි වීම

(ix) යොදා සවන් වෙණ නද රස සුලබව
නදා එකඟ සිත් වත නො ම සකොබව
සදා කුලය නොහැර ම එන අසුබව
එදා ගියේ රිළවුන් සන්සල බව

(අ) මේ පද්‍යය උපුටාගත් කෘතියේ රචකයා නම් කරන්න.

(ආ) රිළවුන්ගේ චංචලභාවය පහව ගියේ කුමක් නිසා ද?

(අ) වැත්තෑවේ හිමි

(ආ) වීණා නාදයේ රසවත් බව නිසා

(x) (අ) 'සද්ධර්මරත්නාවලිය' රචනා වී ඇත්තේ කුමන රජු දවස ද?

(ආ) 'සද්ධර්මරත්නාවලිය' රචනා කිරීම සඳහා පාදක කර ගෙන ඇති ග්‍රන්ථයේ නම කුමක් ද?

(ලකුණු 02 × 10 = 20 යි.)

(අ) II වන පරාක්‍රමබාහු රජ දවස

(ආ) පාලි ධම්මපදට්ඨකථාව

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය** - 1. නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය

ඉගෙනුම් පල -

- සැළලිහිණි සන්දේශයේ නිර්දිෂ්ට කවි අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
- උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
- සිංහබාහු නාට්‍යයේ නිර්දිෂ්ට කොටස්වල අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කරයි.
- උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටස්වල අර්ථ ලිහිල් බසින් ලියයි.
- ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට කොටස්වල අර්ථ ලිහිල් බසින් ලියයි.

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20 යි. (එක් කොටසකට ලකුණු 04 බැගිනි.)**

(අ) කොටස **ලකුණු 02 යි.**

(ආ) කොටස **ලකුණු 02 යි.**

**2.** පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) **සුරරද** සමන් සමගින් සුරඟන එ වර
**පැහැනද** මදාරා පරසතු මල් පතර
කැරපුද වඳින රැඳි මුනි සිරි පා කඹර
සකිසද පෙනේ සමනොළ ගල නැගෙන හිර

**(අ)** තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
**(ආ)** කවියා, සැළලිහිණියා අමතා කරන විස්තරය කෙටියෙන් ලියන්න.

(අ) සු ර ර ද - දිව්‍ය රාජයා
පැහැ න ද - වර්ණවත්/ පැහැයෙන් ආර්ද්‍ර වූ හෙවත් තෙත් වූ

(ආ) උතුමු වූ මිත්‍රය, ඒ කාලයෙහි සුමන සමන් දිව්‍ය රාජයා දිව්‍යාංගනාවන් හා එක් ව වර්ණවත් ව (පැහැයෙන් යුක්ත) මදාරා හා පරසතු යන මල් සමූහය පූජා කොට වඳිනු ලබන්නා වූ බුදුන්ගේ ශ්‍රී පාදය රැඳුණා වූ සමනොළ ගල නැගෙනහිර දෙසින් පෙනේ.

(ii) "එක් දවසක් කඹයේ නටනා එකකුගේ දුවක් හුණදඬු අගක දී නටන එකක් ශිල්ප බලයෙන් උඩ අහස සක්මනුත් කෙරෙයි; නටයි; ගීත් කියයි. එ දවස් උග්ගසේන නම් සිටුපුත් **යාළනු** කෙනකුන් හා සමග මැස්සක් මත්තෙහි සිට ආස සිට නටනා ඒ විද්දත් දුවගේ **හාවභාව ලීලා** දැක වායොධාත්වාධික රූප කලාප විකාරයක් බලවත් නියා ය යි නො සිතා ඈ කෙරෙහි බලවත් වූ ප්‍රෙම ඇති ව 'ලදොත් ජීවත් වෙමි. නො ලදොත් මියෙමි' සිතා ගෙන ඉනා කා නො බී හැඳට නැඟී ලා වැද හොත්තාහ."

**(අ)** තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම දක්වන්න.
**(ආ)** විද්දත් දුව කෙරෙහි බැඳුණු උග්ගසේන සිටුපුත් හැසුරුණු ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(අ) යාළනු - යහළු
හාවභාව ලීලා - ඉඟි බිඟි/ ඇස් කොනින් බැලීම ආදී රාග උපදවන ක්‍රියා

(ආ) ඈ කෙරෙහි බලවත් ප්‍රේමයෙන් ලැබුණොත් ජීවත් වෙමි. නො ලැබුණොත් මිය යමි'යි සිතා ඇඳට නැගී නො කා නො බී වැතිර සිටීම

(iii) කුමුල ගතින් දා
බාහු බෙලෙන් දා
වෙමි සෙ තිදසින් දා
කුරිරු **ගිජින්දා**
කුඹු තල සින්දා
ලම් සෙ **කෙසරින්දා**
මා පිය මිගිඳා කරනා විකුමන්
ඇයි මට බැරි වන්නේ

**(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.**
**(ආ) ඉහත දැක්වෙන උද්ධෘතයේ අර්ථය සරල බසින් ලියන්න.**

(අ) ගිජින්දා - ඇත් රජා/ හස්ති රාජයා/ ඇතා
කෙසරින්දා - කේසර සිංහ රාජයා/ සිංහ රාජයා

(ආ) මම ශක්තිමත්/ විශාල ශරීරයකින් බාහුබලයෙන් ශක්‍රදේවේන්ද්‍රයා සේ වෙමි. කෲර වූ හස්ති රජාගේ කුම්භස්තලය කේශර සිංහ රාජයා විසින් සිඳලන්නා සේ මාගේ පිය සිංහ රජු කරනා වික්‍රමයන් මා හට කළ නොහැක්කේ ඇයි?

(iv) "ඒ කේවට්ටාචාරි එක් දවසක් තුමූ අලුයම් වේලෙහි පිබිද, සුවඳ තෙලෙහි නඟන ලද පහන් ආලෝකයෙන් ගන්ධදාම **පුෂ්පදාමාවලම්බිත** නා නා වර්ණ විචිත්‍ර විතානෝපලක්ෂිත අලංකෘත ශ්‍රී යහන් **ගර්භය** බලන්නාහු මහත් වූ සම්පත් දැක, "මේ මාගේ යසස කවුරුන් සන්තක දෝ හෝ" යි සිතන්නාහු 'අනෙක් කෙනෙකුන් සන්තක නො වෙයි; ..."

**(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.**
**(ආ) මේ පාඨයේ අදහස සරල බසින් ලියන්න.**

(අ) පුෂ්පදාමාවලම්බිත - මල්වැල් එල්ලන ලද
ගර්භය - කාමරය/ ගබඩාව

(ආ) කේවට්ටාචාරි එක දවසක උදෑසන අවදි වී සුවඳ තෙල්වලින් දල්වන ලද පහන් ආලෝකයෙන් සුවඳ දාම, මල් වැල් එල්ලන ලද නොයෙක් වර්ණයෙන් විසිතුරු වියනකින් යුක්ත වූ අලංකාර සිරිය යහන් කාමරය බලා විශාල වස්තුන් දැක, මේ මාගේ කීර්තිය කාට අයත් දැයි සිතන විට වෙන කාහටත් අයිති නො වේ.

(v) දිමුතු යසස් වන් **කුසුම** **සරාගේ**
**නුමුතු** සුවඳ මල් පැලඳ සරාගේ
දකුතු රඟන සුරඟන රඟ ලාගේ
උමතු නො වෙ ද කෙලෙසක සිත කාගේ

**(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.**
**(ආ) දිව්‍යාංගනාවන් රංගනය සඳහා සැරසී සිටි ආකාරය කවියා විස්තර කර ඇත්තේ කෙසේ ද?**

(ලකුණු 04 × 5 = 20 යි.)

(අ) කුසුම සරාගේ - අනංගයාගේ/ මල්සරාගේ/ මින්දදගේ
නුමුතු - නො මිඳුණ/ (සුවඳින්) යුක්ත වූ

(ආ) අනංගයාගේ දීප්තිමත් කීර්තිය වැනි සුවඳ නොමිඳුණා වූ මල් හිස් මුදුනෙහි පැලඳගෙන

**3 ප්‍රශ්නය**

**ඉගෙනුම් පල**

- අවස්ථා සිද්ධි හා චරිත නිරූපණය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් සද්ධර්මරත්නාවලියෙහි නිර්දිෂ්ට කොටස රස විඳිමින් විචාරය කරයි.
- හංස සන්දේශයේ නිර්දිෂ්ට කොටස රස විඳිමින් විචාරය කරයි.

**3.** **උග්ගසේන සිටුපුත්ගේ තීරණය හමුවේ,**

- **ඔහුගේ මවුපියන්ගේ ක්‍රියාකලාපයත්**
- **විද්දත් දුවගේ පියාණන්ගේ ක්‍රියාකලාපයත්**

**අතර ඇති පරස්පරතාව කථා විකාශනයට මහත් පිටිවහලක් වී ඇති අයුරු 'සද්ධර්මරත්නාවලිය' නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.**

**නැතහොත්**

- **පරිසර වර්ණනයේ චමත්කාරයත්**
- **ශ්‍රද්ධා භක්තිය වඩවන වෙහෙර වැනුමත්**

**පාඨකයා ආකර්ෂණය කර ගැනීමට හේතු සාධක වී ඇති ආකාරය 'හංස සන්දේශය' නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.**

**(ලකුණු 15 යි.)**

**<u>උග්සේන සිටුපුත්‍රයාගේ මවුපියන්ගේ ක්‍රියාකලාපය</u>**

- උග්ගසේන සිටු පුත්ගේ මවුපියෝ තම පරම්පරාවේ අභිමානය කෙරෙහි අවධානය යොමු කරති.

  උදා :- "පුත, තෙල ලෙස කිරීම තොපටත් අපටත් තරම් නොවේ"

  "තරම් තැනකින් සරණක් ගෙනවුත් පාවා දෙම්හ"
- තම දරුවා නොගැළපෙන විවාහයෙන් වළක්වා ගැනීම සඳහා උත්සාහ දැරීම
- තම දරුවාට අනාගතයේ දී එල්ල විය හැකි අභියෝග කලින් ම හඳුනාගත් දෙමාපියන් ඔහු යහමඟට ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම

  උදා :- "දෙමවුපියෝ එපවත් අසා බිඳුවන්නට සිතාදෝ කීහ"

  "උන්ගේ යාළුවාණන් ද කැඳවා ලා මසු දහසක් දී ලා "තෙල අහස සිට නැටූ විද්දත් දුවගේ පියාට දී ලා තමාගේ දූව ම පුතුන්ට පාවා දෙන්ට කියව"
- අවසානයෙහි දරුවාගේ මතයට ඉඩ දීම

  මෙම කරුණු ඉස්මතු වන අයුරින් පිළිතුරු ලබා දීම අපේක්ෂා කෙරේ.

**<u>විද්දත් දුවගේ පියාණන්ගේ ක්‍රියාකලාපය</u>**

- තම දියණියන් මුදලට විවාහ කර නො දීම

  උදා :- "ම දූව විකුණන්නා නැත."

  " රන් හැරගෙන නො දෙමි."
- විද්දත් දුවගේ පියා තම දියණියන්ගෙන් යැපෙන බව හා පියාගේ ආත්මාර්ථකාමී ලක්ෂණ

  උදා :- "අපටත් රක්ෂාව නම් ඌ ම වෙ ද?"
- සාමාන්‍යයෙන් දෙමාපියන් දරුවන්ගේ යහපත පැතුව ද විද්දත් දියණියගේ පියා ආත්මාර්ථය ම සලකා තම දියණිය සිටු කුමරුට විවාහ කර දීමට අකමැති වෙයි.

- තමන්ගේ හා දියණියන්ගේ උදවු පිණිස උග්ගසේන සිටු කුමරා විවාහය සඳහා තම කුලයට ඇතුළත් කර ගැනීම

  උදා :- "නො ලදොත් මියෙත් නම් මිය ප්‍රයෝජන කිම් ද? අප හා එක්වන්නා ම දුව පාවා දෙමි."

- තම බෑනණුවන් වන උග්ගසේන සිටු පුත් හට තමන්ගේ විද්දත් ශිල්පය උගන්වා ආර්ථිකයට දායක කර ගැනීම

  උදා :- "මයිලණුවන් කරා ගොසින් තමන් සමර්ථ හෙයින් උන් දන්නා ශිල්ප ඉගෙනගෙන..."

**මෙවැනි උදාහරණ දක්වමින් උග්ගසේන සිටුපුත්ගේ දෙමාපියන්ගේ ක්‍රියාකලාපය සහ විද්දත් දුවගේ පියාණන්ගේ ක්‍රියාකලාපය අතර ඇති පරස්පරතාව විස්තර කර තිබීම අපේක්ෂා කෙරේ. (වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්න.)**

**නැතහොත්**

- හංස සන්දේශ කතුවරයා පාඨක ආකර්ෂණය දිනාගන්නා ආකාරයට චමත්කාර ජනක පරිසර වර්ණනා ඉදිරිපත් කිරීම

කුළින් කුළම සිහිල 'ඹ වැහෙන  කඳුරුය
දොළින් දොළම කල් යල් කරන  කුඹුරුය
පළින් පළම තල් පොල් ගෙ වතු  මැඳුරුය
තළින් තළම පුල් පියුමු 'පුල  පඬෙරුය

පැසෙයි තිබඳ සුවඳැල් කෙත් වත්  අවට
ඇසෙයි ළමා වසුපැටියන් හඬ  දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක්  ලෙසට
රසෙයි අමා රසමය ඒ පියස  දුට

සා ර පලය අඹ දඹ රඹ ද වල්  පිට
මී ර ජලය ඇළ දොළ කඳු පිටින්  බට
නැරු ලොලය වඩවන දුටු දනන්  හට
කෑ ර ගලය වැජැඹෙයි මේ ලෙසින්  සිට

ශබ්දාලංකාරය යොදා ගනිමින් එළිසමය, අනුප්‍රාසය මගින් රසය කුළුගන්වමින් පරිසර වර්ණනයේ චමත්කාරය ජනිත කරන අයුරු දක්වා තිබිය යුතු ය.

ශාන්ත රසය/ ශබ්ද මාධුර්යය පරිසර අලංකාර සඳහා යොදා ගනිමින් අපූර්ව චමත්කාරයක් ඇති කරන ආකාරය විස්තර කිරීම අපේක්ෂිත යි.

➤ ශ්‍රද්ධා භක්තිය වඩවන වෙහෙර වැනුම්

| | |
|---|---|
| නොයෙක් තැන ම පිපි මල් පිරුණු | පොකුණුය |
| ගෙයක් කන ම සැදැහෙන දෙවන | දකුණුය |
| සුදක් ලෙස තිබෙයි මළු මං හැර | කුණුය |
| සියක් අය කෙරෙති වැඳ පුද | පැදකුණුය |
| නිබඳ පැසී පල ලඹ දෙන | මිහිර'ඹය |
| සුවඳ විහිද සිටි විලිකුන් කැන් | රඹය |
| නොමඳ තැනින් තැන වලු බර | වනරඹය |
| එමැද වෙහෙර දිළි දුර ලන | සසරබය |
| පවන්' ද පිපි තු රේ ය නිර | තුරේ ය |
| කුසුමන් පෙති තු රේ ය මළු | තුරේ ය |
| අවට සුපිපි සී රේ ය බිඟු | සරේ ය |
| සිත එවෙහෙර කෙ රේ ය ලොබ | කෙරේ ය |

විහාරය හා ඒ අවට පරිසරයේ ඇති ශාන්ත බව පාඨක ශ්‍රද්ධා භක්තිය වර්ධනය කිරීම උදෙසා ඉවහල් වන අයුරු විස්තර කර තිබීම අපේක්ෂිත වේ.

මෙවැනි යෝග්‍ය උදහරණ දෙක බැගින් දක්වමින් ලියා තිබීම ප්‍රමාණවත් ය. වෙනත් සුදුසු උදාහරණ දී ඇත්නම් ඒවා ද පිළිගන්න.

**ප්‍රශ්න අංකය 05,06,07**

**ඉගෙනුම් පල**

අවස්ථා සිද්ධි හා චරිත නිරූපණය පිළිබඳ සැලිකිලිමත් වෙමින් අමාවතුරෙහි අඟුල්මල් දමනය රස විඳිමින් විචාරය කරයි.

- **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.**

**5. සාවද්‍ය උපකල්පනයක පිහිටි ගුරුවරයකු තම ගෝලයකු අඳුරේ හෙළීම සඳහා ක්‍රියා කළ ආකාරය 'අමාවතුර' නිර්දිෂ්ට කොටස ඇසුරින් උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.** (ලකුණු 10 යි.)

❖ සාවද්‍ය උපකල්පනයක පිහිටි ගුරුවරයෙකු තම ගෝලයෙකු අඳුරේ හෙළීම සඳහා ක්‍රියා කළ ආකාරය අඟුල්මල් දමනයෙහි එන ඇදුරුතුමාගේ චරිතය ඇසුරින් උදාහරණ සහිත ව තහවුරු කර ගත හැකි ය.

❖ සිසුන් අහිංසක මානවකයා කෙරෙහි දැක්වූ ඊර්ෂ්‍යා සහගත ආකල්පය

"අහිංසක මානවකයා ආ තැන් පටන් ගෙනැ ඇපි නො පෙනම්හ"

❖ සිසුන් කණ්ඩායම් තුනක් ව ගොස් අහිංසක කුමරු ආචාර්යවරයාගේ බිරිඳ සමඟ අනියම් සබඳතාවක් ඇති බව කීම

"අප නො හදහා නම් තෙපි මැ පිරික්සා බලව"

❖ සිසුන්ගේ මුසා බස් ආචාර්යවරයා පිළිගත් බව

"ඇය හා ඔහු සසඟ ඇති සෙයැ'යි බිඳී 'ඔහු මරමී සිතී"

❖ ආචාර්යවරයා ක්‍රියාකරන ආකාරයෙන් ඔහුගේ සිතෙහි සංකීර්ණ ස්වභාවය මෙන් ම ගූඪ චෛතසික ධර්මවල බියකරු බව පිළිබිඹු වීම

"ශිල්ප උගන්නට එන්නො නොවෙති." එසේ වන්නා හා මට ලාභ පිරිහෙයි.

❖ ශිල්ප හමාර කිරීම වෙනුවෙන් පූජාවක්, උපචාරයක් කළ යුතු බව. ගුරුතුමාගේ ද්වේශ සහගත සිතුවිලි හා බියකරු බව පෙන්නුම් කරන අවස්ථා

"පුතැ මිනිස් දහසක් මැරුව මැනැවැ" එසේ වන්නා ශිල්පයට උපචාර කළා වේ.

මෙවැනි යෝග්‍ය උදාහරණ තුනක්වත් දක්වමින් පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතුය.
සුදුසු වෙනත් උදාහරණ ද පිළිගන්න.

**6.** සොබා දහමේ විවිධ සංසිද්ධීන් විස්තර කිරීමේ දී උචිත කාව්‍යෝක්ති යොදා ගැනීම 'ගංගාවේ සංගීතය' පැදිපෙළේ සාර්ථකත්වයට හේතු වී ඇත. නිර්දිෂ්ට පැදිපෙළ ඇසුරින් උදාහරණ **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 10 යි.)

❖ සොබාදමේ විවිධ සංසිද්ධීන් විස්තර කිරීමේ දී උචිත කාව්‍යෝක්ති යොදා ගැනීම ගංගාවේ සංගීතය පැදි පෙළේ සාර්ථකත්වයට හේතු වී ඇත.

කලදෝ දියෙන් පොඟවා රන් පුලින තලා

ඇකයෙහි හෙලා හඬ වයි සැඩ සුළඟ රැයේ

රන්තරු පිරිවරා ගත් සඳ මඬල යට

සම තැනිතලාවල හමුවෙයි අලසකම
නිරසයි අතරමඟ අවහිර නුදුටු බිම

❖ රසවත් වූ කාව්‍ය භාෂාව, කාව්‍ය අලංකාර ආදිය කාව්‍යෝක්ති භාවිතය නම් වේ. එහි ශබ්දාලංකාර මෙන් ම අර්ථාලංකාර ද අඩංගු වේ.

**අර්ථාලංකාර**

රන්තරු පිරිවරා ගත් සඳ මඬල යට
මහ වන බිමක් මැද ගිරි කුළු අතර සිට
නොමියන හේලි දහමක පණිවුඩය පිට
කොඳුරමි කෙදිරියක් මුළු ලොව නිසල කොට

කඳු බැවුමක දං බෝවිටි පඳුරු තළා
පහළට ඇදී පර මල් පෙති ඉවත නොළා
කලදෝ දියෙන් පොඟවා රන් පුලින තලා
සංගීතවත් වී යමි ඉදිරියට ගලා

**ශබ්දාලංකාර**

සැඟවෙමි-එබෙමි-නිසසල වෙමි- සසල වෙමි
ඇඹරෙමි- එහෙත් පසු නොබසිමි- නොනවතිමි

**රූපකාලංකාර**

හිරිමල් සිනා රැළි පෙණ පිඩු මිහිරි තම
ගල් පරවල ම හැපි හැපි බිහි කරමි මම

**7. යහපත් ජීවිතයකට අවශ්‍ය මග පෙන්වීම් ලබා දීමට ජන කවියා උත්සුක වී ඇති අයුරු 'හානා හීය පානා අඬහැරෙන් දැනේ' පාඨම ඇසුරින් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි.)**

❖ යහපත් ජීවිතයකට අවශ්‍ය මග පෙන්වීම් ලබාදීමට ජන කවියා උත්සුක වී ඇති ආකාරය 'හානා හීය පානා අඬ හැරෙන් දැනේ' පද්‍ය පන්තියෙන් නිරූපිත යි.

❖ පොදු ජන ජීවන අද්දැකීම් පාදක කර ගනිමින් බිහි වූ උපදේශාත්මක ජන කවි තුළින් යහපත් ජීවිතයකට අවශ්‍ය මග පෙන්වීම සිදු කරයි.

❖ සාමාන්‍ය ජන ජීවිතයේ දී තම කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා උපදෙස් ලබා දෙන අයුරු

ගසට කෙටුම ගස මුල පැයුමෙන් දැනේ
මිනිහා නොමිනිහා යන කඩිසරෙන් දැනේ
අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දැනේ
හානා හීය පානා අඬහැරෙන් දැනේ

ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු
බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු
කඩුල්ලේ තරම දැනගෙන කද බඳිනු
තමුන්ගේ තරම දැනගෙන කල් හරිනු

ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද
දත නැති දා උක් දඬු ගිනි තපින්ට ද
වෙර නැති දා ගහගත්තේ දිනන්ට ද
යුද ඇති දා නැති කග කොස් කොටන්ට ද

❖ උනන්දුවෙන් හා කැපවීමෙන් අභියෝග සහ විවේචන හමුවේ කටයුතු කළ යුතු බවට උපදෙස් ලබා දීම

වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණේ වැඩ කළා නොවේ
වරද පෙනෙති වැඩ නූගත් අයට ලොවේ
වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ

❖ සාර්ථක විවාහ ජීවිතයක් සඳහා උපදෙස් ලබාදීම

එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා
වෙන් උන දාට යක් දෙබරේ වද සේමා

අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනි හුළ දියේ හෙලා
අනුන් ලියන් දැක තම ලියට තලා
දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා

❖ වැඩිහිටි ජීවිත සාර්ථක කර ගැනීම සඳහා උපදෙස් ලබා දීම

නහින දෙහින කාලෙට පින් කෙරුම යුත
වහින කලට කුරින් විල්වලින් එත
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
පනින රිලවුංට ඉනිමං කමක් නැත

රන්විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
මිනිබරණින් සැදූ මුත් ගත නොදිරත්ද
පැණිවරකා ගසටත් හෙන නොවදිද්ද

මෙවැනි යෝග්‍ය උදාහරණ තුනක් දෙමින් පිළිතුරු ලියා තිබීම ප්‍රමාණවත් ය.
(වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්න.)

****